Local Loans and Development Fund

අප හා එක්වීමට

අධ්‍යක්ෂක +94112687513

කාර්යාලය +94112687514

වෙබ් අඩවිය http://www.lldf.gov.lk

ෆැක්ස් +94112691261

lldf1916@gmail.com

නො.24/ඒ, වෝඩ් පෙදෙස,

කොළඹ 07.

වසරේ බදු පසු ලාභය මිලි.59.7

කොමසාරිස්වරුන් සංඛ්‍යාව 14

අනුමත කාර්ය මණ්ඩලය 46

ආඥා පනතින් ආවරණය වන

මහ නගර සභා ගණන 24

නගර සභා ගණන 41

ප්‍රාදේශීය සභා ගණන 276

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ක්‍රීය අරමුදලින් ලබා දුන් ණයවලින් වර්ෂය තුළ අය කර ඇති ණය වාරික ප්‍රමාණය රු. මි.307.8කි.

වර්ෂය තුළ පළාත් පාලන ආයතන වෙත නිකුත් කර ඇති මුළු ණය වටිනාකම රු. මි.388.9කි.

වෙනත් ආයතන හා ව්‍යාපෘතිවලින් ලබා දෙන ලද ණයවලින් වර්ෂය තුළ අය කර ඇති ණය වාරික ප්‍රමාණය රු. මි.161.3කි.

අරමුදල්:- ණය ලබා දීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී ප්‍රතිශතයක් මත මධ්‍යම රජයේ වාර්ෂික අයවැයෙන් දීර්ඝ කාලීන ණය මුදලක් වශයෙන් 2009 වර්ෂය දක්වා පමණක් ලබාගන්නා ලදී.තවද ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) යටතේ ක්‍රියාත්මක වූ නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය සහ ණය අංක 2201 SRI (SF) යටතේ ක්‍රියාත්මක වූ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අරමුදල් ණය නිකුත් කිරීම සඳහා උපයෝගී කර ගනී.

වෙනත් ආයතන හා ව්‍යාපෘතිවලින් ලබා දෙන ලද ණයවලින් වර්ෂය තුළ අය කර ඇති ණය පොළී මුදල් ප්‍රමාණය රු. මි.73.8කි.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ක්‍රීය අරමුදලින් ලබා දුන් ණයවලින් වර්ෂය තුළ අය කර ඇති ණය පොළී මුදල් ප්‍රමාණය රු. මි.186.6කි.

විගණකවරු:-විගණකාධිපති දෙපාර්තමේන්තුව

අභ්‍යන්තර විගණනය:- 2023 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන අංශයක් ආරම්භ කර අභ්‍යන්තර විගණන නිලධාරිවරයෙක් පත් කිරීමට කටයුතු කර ඇත.

වර්ෂයේ මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලද මුළු ණය වාරික ප්‍රමාණය රු.මි.16කි. පොළිය රු.මි.4.7කි.

බැංකුකරුවෝ: ලංකා බැංකුව

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ දැක්ම

තිරසර ණය පහසුකම් සහ උපකාරක සේවා ලබාදීමෙන් ප්‍රාදේශීය මට්ටමේ යටිතල පහසුකම් මූල්‍යකරණය සහ සේවා සඳහා ප්‍රමුඛතම මූල්‍ය ආයතනය වීම

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනය උදෙසා,
පළාත් පාලන ආයතනවලට,
එම ආයතනවල
මූලික යටිතල පහසුකම් සේවා සහ ආර්ථිකමය ව්‍යාපෘති සඳහා දිගුකාලීන මූල්‍ය සහ සේවා සපයන ස්වාධීන සහ තිරසර මූල්‍ය ආයතනයක් ලෙස කටයුතු කිරීම

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ Core Values ප්‍රධාන අගයන් සහ අරමුණු


Core Values ප්‍රධාන අගයන්

- මූල්‍යකරණ සහ සේවා පහසුකම් වැඩි දියුණු කිරීම
- මූල්‍යකරණ සහ සේවා පහසුකම් සපයන පළාත් පාලන ආයතන සංඛ්‍යාව වැඩි කිරීම
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල පිළිබඳව ප්‍රචලිත කිරීම
- තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම
- ණය ලබා දෙන ක්ෂේත්‍ර හරිත, සාමාජීය සහ ලාභ උත්පාදන ව්‍යාපෘති දක්වා පුළුල් කිරීම
- ණය ලබා දීමේ උපකාරක සේවාවන් සහ අභ්‍යන්තර ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීම


අරමුණු

- නිහ ණය මුදල් අය කිරීම වසරකට **10%**කින් වැඩි කිරීම.
- ණය ලබා දෙන පළාත් පාලන ආයතන සංඛ්‍යාව වසරකට **50%**කින් වැඩි කිරීම.
- **2028** වර්ෂය වන විට පළාත් පාලන ආයතන සංවර්ධනය සඳහා රු.බිලියන **05**ක මූල්‍ය සහන ලබා දීම.
- ඉදිරි පස් වසර තුළ පළාත් පාලන ආයතන **200**කට වැඩි ප්‍රමාණයකට ණය මුදල් ලබා දීම.
- පළාත් පාලන ආයතනවලට පරිසර හිතකාමී, සමාජ සුභසාධන සහ ලාභදායී ව්‍යාපාරවලට ණය ලබා දීමට පෙළඹවීම.
- අභ්‍යන්තර ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම **(Automation)** තුලින් ශක්තිමත් කිරීම.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
පළාත් පාලන ආයතන විසින් ලබා ගන්නා ලද ණය
පළාත් අනුව - 2023



වාර්ෂික වාර්තා සම්පිණ්ඩනය



අස්ථිත්ත්වය හඳුනා ගැනීම

හැඳින්වීම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 1916 අංක 22 දරණ ආඥා පනතට අනුව සංස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

මෙම ආඥා පනත පහත ආඥා පනත් හා පනත්වලින් මේ දක්වා සංශෝධනය කර ඇත.

- 1930 අංක 06 දරණ ආඥා පනත
- 1931 අංක 25 දරණ ආඥා පනත
- 1938 අංක 43 දරණ ආඥා පනත
- 1942 අංක 21 දරණ ආඥා පනත
- 1946 අංක 29 දරණ පනත
- 1974 අංක 09 දරණ පනත
- 1993 අංක 24 දරණ පනත

මෙම ආයතනය ආරම්භයේ සිට පළාත් පාලනය පිළිබඳ විෂය භාර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. 2020 වර්ෂයේ සිට මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අතර, 2022 වර්ෂයේ සිට රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ණය මුදල් සැපයීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොලී පදනමක් මත වසර 25කින් ආපසු ගෙවීය යුතු ණය මුදලක් වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන ඇත. 2009 වර්ෂයෙන් පසුව පළාත් පාලන ආයතන වෙත ණය මුදල් ලබා දීම හෝ වැටුප් හා කාර්යාලීය පරිපාලන වියදම් සඳහා කිසිදු මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන නොමැත.

අතීතයේ සිට ආ ගමන් මඟ

1916 අංක 22 දරන දේශීය ණය සහ සංවර්ධන ආඥා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර, ඉන් පසුව මුල් පනතට යම් යම් සංශෝධන සිදු කරන ලද අතර අවසාන සංශෝධනය 1993 අංක 24 දරන පනත මඟින් සිදු කරන ලදි.

මුල් අවධියේ දී මෙම අරමුදල මඟින් ඕනෑම පළාත් පාලන ආයතනවලට සහ සමූපකාර සමිතිවලට ඕනෑම මහජන උපයෝගීතා කටයුත්තක් සඳහා ණය පහසුකම් සපයන ලදි. 1974 අංක 09 දරන දේශීය ණය සහ සංවර්ධන සංශෝධිත පනත මඟින් ණය ලබා දීමේ අරමුණු පළාත් පාලන ආයතනවලට පමණක් සීමා වී ඇත.

වර්ෂ 1984 දක්වා, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදල කළමනාකරනය කළ අතර මෙම කාලය තුළ පළාත් පාලන ආයතනවලට ණය දීමේ කාර්යය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම භාවිතා කර නොමැත.

1985 වර්ෂයේ දී මෙම ආයතනය ලෝක බැංකුව මඟින් අරමුදල් සපයන නාගරික වැඩසටහන් ඒකකයට අනුයුක්ත කරන ලදි. මෙම කාල සීමාව තුළ පළාත් පාලන ආයතන දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ප්‍රමුඛ අරමුදල් මූලාශ්‍රයක් ලෙස පිළිගනු ලැබීය.

1995 වර්ෂයේ දී ලෝක බැංකුවේ මූල්‍ය අනුග්‍රහය තිබූ, නාගරික වැඩසටහන් ඒකකය වසා දැමූ විට දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙනම ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. ඒ අනුව ස්ථීර කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන ඇත.

2000 වර්ෂයේ දී, දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ පොළී ආදායම පුනරාවර්තන වියදම් පියවා ගැනීමට තරම් ප්‍රමාණවත් වූ බැවින් ඒ සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ප්‍රතිපාදන ඉල්ලුම් කර නොමැත. කෙසේ වෙතත්, පළාත් පාලන ආයතන සඳහා ණය ලබා දීම සඳහා අරමුදල් භාණ්ඩාගාරයෙන් ලැබී ඇත්තේ සහනදායී පොලී අනුපාතයකට ආපසු ගෙවිය යුතු ණයක් ලෙසය.

තවද, දේශීය ණය සහ සංවර්ධන අරමුදල, පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අරමුදල් යෙදවීමට සුදුසුම සංවිධානය ලෙස ආසියානු සංවර්ධන බැංකුව විසින් හඳුනා ගෙන ඇත.

ආසියානු සංවර්ධන බැංකුව වැනි විදේශාධාර ව්‍යාපෘති මගින් පළාත් පාලන ආයතන වෙත ලබාදී ඇති ණය මුදල් අයකිරීමේ වගකීමද ගිවිසුම් ප්‍රකාරව දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පවරා ඇත.

එම ව්‍යාපෘති පහතින් දැක්වේ.

1. ADB Loan No.899 : PCDP: බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය
(Perennial Crop Development Project - Total Rs.77m.)
2. ADB Loan No.1632 : UDLIHP: නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
(Urban Development Low Income Housing Project – Over Rs.2,270m.)
3. ADB Loan No.2201 : LGIIP: පළාත් පාලන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය
(Local Government Infrastructure Improvement Project – Over Rs.5,000m.)

ඒ අනුව 1998 වර්ෂයේ දී ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දුන් ණය සඳහා ආපසු අය කර ගැනීමේ නියෝජිතයා ලෙස දේශීය ණය සහ සංවර්ධන අරමුදල පත් කර ඇත. මෙම ණය අය කර ගැනීමේ ගිවිසුම් යටතේ අය කරන පොලී ආදායමෙන් 2.5%ක ප්‍රමාණයක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ආදායමක් ලෙස ලබා දෙනු ලැබේ.

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ලද නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියෙන් (UDLIHP) රුපියල් මිලියන 2270ක් සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් (LGIIP) රුපියල් මිලියන 4500ක් අයකර ගැනීමට භාරගෙන ඇත.

වර්තමානය

ආඥා පනතේ අරමුණු


දේශීය ණය සහ සංවර්ධන අරමුදල සංස්ථාපනය කරන ලද ආඥාපනතින් හෝ එම ආඥාපනතට කරන ලද සංශෝධනවලට අනුව, ශ්‍රී ලංකාව තුල මහ නගර සභා 24, නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276 ලෙස සංස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 342න් 341 ක් (කොළඹ මහ නගර සභාව හැර) සඳහා ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී පදනමක් මත සැපයීම මූලික කාර්යභාරය වේ.

වෙනත් ආයතන හා ව්‍යාපෘති මඟින් ලබා දී ඇති ණය මුදල්වල ණය වාරික හා පොළිය අය කිරීම ද අමතර කාර්යයක් ලෙස ඉටු කරනු ලැබේ. දේශීය ණය සංවර්ධන අරමුදල මෙම කාර්යය ඉටු කිරීමෙන් (ණය අය කිරීම පදනම් කර ගනිමින්) ද ආදායම් උපයා ගනී.

ඉහත සඳහන් කාර්යය කිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදල විවිධ වූ අංශ පිහිටුවා ඒ එක් එක් අංශ සඳහා කාර්යයන් පවරා දී ඇත. එනම්

- පාලන අංශය
- මූල්‍ය අංශය
- මෙහෙයුම් අංශය
- මෙහෙයුම් හා පාලන අංශය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල පිහිටුවන අවස්ථාවේ එහි ප්‍රධාන ක්‍රියාවලිය



එක් එක් අංශයන්හි කාර්යයන්

පාලන අංශය

- තැපෑල (ලැබීම් / යැවීම්)
- සේවා හා නඩත්තු කටයුතු
- භාණ්ඩ හා සේවා සඳහා ප්‍රසම්පාදන කටයුතු කිරීම
- කොමසාරිස් මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා ඒ සම්බන්ධ වෙනත් කටයුතු
- පුහුණුවීම්, වැඩමුළු හා කාර්ය මණ්ඩල රැස්වීම් සංවිධානය හා වාර්තාකරණය
- වැටුප් සැකසීම, වැටුප් වර්ධක, අතිකාල සැකසීම, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් ආදිය පිළියෙල කිරීම හා ගෙවීම් කිරීම
- පුද්ගලික ලිපි ගොණු, බඳවා ගැනීම්, උසස් කිරීම් හා ඊට අදාළ වාර්තා හා ගොණු පවත්වා ගැනීම
- දේශීය හා විදේශීය නිවාඩු සම්බන්ධ කටයුතු කිරීම
- සේවක මණ්ඩල ණය හා අත්තිකාරම් සම්බන්ධ කටයුතු
- සුබසාධන කටයුතු
- වට්ටෝරු පොත් හා සංගණන කටයුතු

මූල්‍ය අංශය

- චෙක්පත් ලේඛනගත කිරීම හා චෙක්පත් බැංකුගත කිරීම
- මුදල් පොත ලිවීම
- ණය ලෙජර්වලට පිටපත් කිරීම
- ප්‍රධාන ලෙජරයේ සටහන් කිරීම
- වවුචර් ලිවීම, ගෙවීම හා චෙක්පත් මුද්‍රණය
- මූල්‍ය ආයෝජනය හා කළමනාකරණය
- සුළු මුදල්, ඉන්ධන හා අනෙකුත් අත්තිකාරම්
- අභ්‍යන්තර හා බාහිර විගණන කටයුතු
- අයවැය සැකසීම හා ඉදිරි සැලසුම් සකස් කිරීම
- අවසන් ගිණුම් පිළියෙල කිරීම හා වාර්ෂික වාර්තා සැකසීම


මෙහෙයුම් හා පාලන අංශය

- පරිගණක වැඩසටහන්, අන්තර් ජාලය ඇතුළු මෘදුකාංග අධීක්ෂණය, පරිපාලනය හා යාවත්කාලීන කිරීම
- දේශීය හා විදේශීය ණය සැපයුම් ආයතන සමඟ සම්බන්ධතා පැවැත්වීම හා අවශ්‍ය සේවා හා සැපයුම් කිරීම

මෙහෙයුම් අංශය

- වාරික පොළිය ගණනය කිරීම
- ලදුපත් ලිවීම
- ණය තොරතුරු පද්ධතිය සැකසීම (හිඟ ණය හා ලැබිය යුතු පොළිය)
- ණය ඉල්ලුම් පත්‍ර ලේඛනගත කිරීම
- ලේඛනගත කරන ලද ණය ඉල්ලුම් පත්‍ර විශ්ලේෂණය හා එහි ඇති යාවත්කාලීන කළයුතු ලේඛන සැකසීම හා ඒවා ණය කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම
- ණය අනුමත ලිපි යැවීම, ගිවිසුම් අත්සන් කිරීම හා අපගේ කොන්දේසිවලට අනුව ණය මුදල් නිකුත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ හා අනුමැතිය ලබා ගැනීම
- නිකුත් කරන ලද ණය මුදල් මඟින් කරන ලද ව්‍යාපෘති පරීක්ෂාව හා අධීක්ෂණය කර එහි ප්‍රතිඵල සංඛ්‍යා ලේඛන මඟින් තොරතුරු පවත්වා ගැනීම
- ණය මුදල් සම්බන්ධයෙන් අවස්ථානුකූලව පැන නගින ගැටළු හා පරීක්ෂණ සඳහා අවශ්‍ය තොරතුරු මඟින් විසඳුම් හෝ පිළිතුරු සැපයීම
- ක්ෂේත්‍රගත සංවර්ධන නිලධාරීන් අධීක්ෂණය හා අවශ්‍ය මෙහෙයුම් කටයුතු සිදුකර ගැනීම

සංවිධාන ව්‍යුහය


කොමසාරිස් මණ්ඩලය
සභාපති
අධ්‍යක්ෂක/ ප්‍රධාන විධායක නිලධාරී (01)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය සහ පරිපාලන) (01)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්) (01)
සහකාර ගණකාධිකාරී (01)
පරිපාලන නිලධාරී (01)
සංවර්ධන නිලධාරී(02)
සංවර්ධන නිලධාරී(01)
සංවර්ධන නිලධාරී(22)
කළමනාකරණ සහකාර(06)
කළමනාකරණ සහකාර(01)
කළමනාකරණ සහකාර(01)
කළමනාකරණ සහකාර(03)
රියදුරු(02)
කා.කා.සේ. (02)

මෙහෙයුම් හා මූල්‍ය කාර්ය සාධනය

මෙහෙයුම් කාර්ය සාධනය


2023 වර්ෂයේ මෙහෙයුම් කාර්යසාධනය පහත පරිදි එක් එක් අංශ යටතේ සාකච්ඡා කර ඇත.

- ණය නිකුත් කිරීම
- ණය ආපසු අය කර ගැනීම
- භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම

2023 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මි.750 ක මුදලක් ඇස්තමේන්තු ගතකර තිබුණි. වර්ෂය තුලදී පළාත් පාලන ආයතන 11 ක් වෙත නිකුත්කළ මුළු ණය වටිනාකම රු.මි.388.9 කි. මෙම ණය මුදල් සහනදායී පොළී ප්‍රතිශතයක් මත වසර 5-10 කින් ආපසු ගෙවිය යුතු වේ. මෙම වර්ෂය තුලදී පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම ප්‍රතිශතයක් ලෙස ගත් කළ 52%කි. ණය වල අවදානම් කළමනාකරණය සිදුකර ගැනීම, ණය ආපසු අයකර ගැනීමේ ක්‍රමවේදය හා ව්‍යාපෘති වල මූල්‍ය ශක්‍යතාවය මත පදනම්ව ණය ලබාදීම සිදුකර ඇත. එම නිසා මෙම වර්ෂය තුලදී ලබාදුන් ණය මුදල් අතුරින් 78%ක් අදායම් උත්පාදක ව්‍යාපෘති වන අතර, 22%ක් සමාජ සුභසාධන ව්‍යාපෘති ලෙස වර්ගීකරණය කළ හ.

2023 වර්ෂය තුලදී ණය නිකුත් කිරීමේ සාරාංශය (වගු අංක 1.1)

	ව්‍යාපෘති වර්ගය	පොළී ප්‍රතිශතය (වාර්ෂික)	මුදල (රු.)	ව්‍යාපෘති සංඛ්‍යාව
1	ආදාහනාගාර ඉදිකිරීම	6.50%	14,315,000	1
2	පොදු වෙළඳ සංකීර්ණ ඉදිකිරීම	12.00%	303,120,000	8
3	කාර්යාල ගොඩනැගිලි සහ මහජන පුස්තකාල ඉදිකිරීම	7.00%	71,523,195	2
	එකතුව		**388,958,195**	**11**



(රූප සටහන් අංක 1.1) ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

2023.12.31 දිනට ණය නිකුත් කිරීම (විස්තරාත්මකව) (වගු අංක 1.2)


	පළාත් පාලන ආයතනය	පළාත	මුදල (රු.)	මලාපවහන කටයුතු සඳහා ගලි බවුසර් මිලදී ගැනීම	සම්මන්ත්‍රණ ශාලා ඉදිකිරීම	සූර්ය කෝෂ පද්ධති	ආදාහනාගාර ඉදිකිරීම	පොදු වෙළඳ සංකීර්ණ ඉදිකිරීම	කාර්යාල ගොඩනැගිලි සහ මහජන පුස්තකාල ඉදිකිරීම
1	පුත්තලම න.ස	වයඹ	96,570,000	-	-	-	-	96,570,000	-
2	පොළොන්නරුව ම.න.ස	උතුරු මැද	5,300,000	-	-	-	-	5,300,000	-
3	උඩුබද්දාව ප්‍රා.ස	වයඹ	1,500,000	-	-	-	-	1,500,000	-
4	වැලිවිටිය දිවිතුර ප්‍රා.ස	දකුණු	14,315,000	-	-	-	14,315,000	-	-
5	මීගමුව ම.න.ස	බස්නාහිර	52,801,195	-	-	-	-	-	52,801,195
6	කුලියාපිටිය ප්‍රා.ස	වයඹ	13,471,000	-	-	-	-	13,471,000	-
7	කුරුණෑගල ම.න.ස	වයඹ	91,792,000	-	-	-	-	91,792,000	-
8	නුවරඑළිය ම.න.ස	මධ්‍යම	71,375,000	-	-	-	-	71,375,000	-
9	අයගම ප්‍රා.ස	සබරගමුව	7,012,000	-	-	-	-	7,012,000	-
10	කැකිරාව ප්‍රා.ස	උතුරු මැද	18,722,000	-	-	-	-	-	18,722,000
11	මීගමුව ම.න.ස	බස්නාහිර	16,100,000	-	-	-	-	16,100,000	-
	එකතුව		**388,958,195**	**-**	**-**	**-**	14,315,000	303,120,000	71,523,195

ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

ණය නිකුත් කිරීමේ ප්‍රගතිය - පළාත් අනුව - 2023 වර්ෂය (වගු අංක 1.3)

පළාත	මුදල (රු.)	ප්‍රතිශතය (%)
වයඹ	203,333,000	52
මධ්‍යම	71,375,000	18
බස්නාහිර	68,901,194	18
උතුරු මැද	24,022,000	6
දකුණු	14,315,000	4
සබරගමුව	7,012,000	2
එකතුව	**388,958,194**	**100**


ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023



රූප සටහන් අංක 1.2 - ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

ණය නිකුත් කිරීම - පළාත් පාලන ආයතන වර්ගය අනුව-2023 (වගු අංක 1.4)

පළාත් පාලන ආයතන වර්ගය	මුදල (රු.)	ප්‍රතිශතය (%)
මහ නගර සභා	237,368,194.70	61
නගර සභා	96,570,000.00	25
ප්‍රාදේශීය සභා	55,020,000.00	14
එකතුව	388,958,194.70	100



(රූප සටහන් අංක 1.3) ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

ණය ආපසු අයකිරීම


2023 වර්ෂය තුලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වක්‍රීය අරමුදල් වලින් ලබාදුන් ණය වලින් ණය වාරික වශයෙන් රු.මි.**307.8** ක් ද පොළී මුදල් වශයෙන් රු.මි.**186.6** ක් ද පළාත් පාලන ආයතනයන්ගෙන් ආපසු අයකරගෙන ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය තුලින් රු.මි.**97.4**ක් ණය වාරික වශයෙන් ද රු.මි.**44.0**ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය තුලින් රු.මි.**3.3** ක් ණය වාරික වශයෙන් ද රු.මි.**3.2** ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත.පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.**60.6** ක් වාරික වශයෙන්ද රු.මි.**26.6** ක් පොළී වශයෙන් ද ආපසු අයකරගෙන ඇත.

ණය ආපසු අයකිරීමේ ප්‍රගතිය - 2023 (වගු අංක 1.5)

	වාරික අයකිරීම් (රු.මි)	පොළී අයකිරීම් (රු.මි)	එකතුව (රු.මි)
LLDF	307.8	186.6	494.4
PCDP	3.3	3.2	6.5
UDLIHP	97.4	44	141.4
LGIIP	60.6	26.6	87.2
එකතුව	469.1	260.4	729.5

ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

ණය වාරික සහ පොළී මුදල් අයකිරීමේ ප්‍රගතිය




(රූප සටහන් අංක 1.4) ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

LLDF - දේශීය ණය සහ සංවර්ධන අරමුදල
PCDP - බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත්කළ ණය මුදල්
UDLIHP - නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
LGIIP - පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

කාර්ය සාධනය 2019–2023

(ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති හැර)(රු.000) (වගු අංක 1.6)

වර්ෂය	නිකුත් කළ ණය	ණය වාරිකඅයකිරීම්	ණය පොළී අයකිරීම්
2019	652,381	241,004	107,627
2020	614,336	328,177	130,502
2021	847,905	498,813	168,477
2022	769,864	314,784	170,650
2023	388,958	307,823	186,668
එකතුව	3,273,444	1,690,601	763,924



(රූප සටහන් අංක 1.5) ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

මූල්‍ය කාර්ය සාධනය

ආදායම - 2023 වර්ෂය

වර්ෂය තුල උපයාගන්නා ලද දළ ආදායම රු.මි.**197.6**කි (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති මගින් නිකුත්කළ ණය මුදල් ද ඇතුළුව). ආයතනයේ පරිපාලන වියදම් සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වලට ලබාදී ඇති ප්‍රදානයන් වෙන් කිරීමෙන් පසු බදු පෙර ශුද්ධ ලාභය රු.මි.**96.4**කි. 2023 වර්ෂයේ ගණනය කරන ලද ණය හානිකරණයේ අගය රු.මි.**167.5** කි.

පසුගිය වර්ෂ 05 ක මූල්‍ය සමාලෝචනය - (රු.000 වලින්) (වගු අංක 1.7)

විස්තරය	2019	2020	2021	2022	2023
ආදායම					
පොළී ආදායම	266,181	274,899	275,545	289,204	307,142
භාණ්ඩාගාර ණය පොළී	(134,813)	(131,744)	(126,304)	(113,769)	(109,444)
ශුද්ධ ආදායම	**131,367**	**143,154**	**149,240**	**175,435**	**197,698**
වෙනත් ආදායම්	133,929	86,101	63,434	165,600	139,346
මුළු මෙහෙයුම් ආදායම	**265,290**	**229,255**	**212,674**	**341,035**	**337,045**
ණය හානිකරණ අගයන්	(4,687)	(7,646)	(9,956)	(340,829)	(167,561)
ශුද්ධ මෙහෙයුම් ආදායම	**260,607**	**221,610**	**202,718**	**681,864**	**169,483**
පරිපාලන වියදම්	(41,073)	(38,151)	(40,505)	(44,506)	(73,052)
පළාත් පාලන ආයතන වෙත විශේෂ ප්‍රදාන (Grant Amortization)	**(153,588)**	**(115,998)**	**(74,910)**	**(29,997)**	-
බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය	**65,948**	**67,460**	**87,303**	**607,361**	**96,430**
ආදායම් බදු ගෙවීම්	(3,274)	(2,495)	(16,237)	(36,418)	(36,688)
ශුද්ධ ලාභය	**69,222**	**69,955**	**71,066**	**570,943**	**59,742**
විස්තීරණ ආදායම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය	**69,385**	**69,122**	**67,821**	**573,679**	**57,579**
වර්ෂ අවසානයේ මුළු රඳවාගත් ඉපයුම් (හිමිකම)	**(176,018)**	**(105,196)**	**(37,315)**	**(220,179)**	**(342,864)**

ප්‍රභවය: දේ.ණ.සං.අ. මූල්‍ය ප්‍රකාශ 2023


2023 වසරේ භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්

2023 වර්ෂය තුලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදල ලබා ගන්නා ලද ණය මුදල සඳහා ණය වාරික සහ පොළී මුදල් වශයෙන් පිළිවෙලින් රු.මි.16.0 ක් සහ රු.මි.4.7 ක් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ රු.මි.85.4ක් ණය වාරික වශයෙන් ද රු.මි.53.3 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.147.9 ක් ණය වාරික වශයෙන් ද රු.මි.44.3 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි.3.1 ක් ණය වාරික වශයෙන් ද රු.මි.3.5 ක් පොළී වශයෙන් ද ආපසු ගෙවා ඇත.

2023 වසරේ භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය (වගු අංක 1.8)

	වාරික ගෙවීම් (රු.මි)	පොළී ගෙවීම් (රු.මි)	එකතුව (රු.මි)
LLDF	16	4.7	20.7
PCDP	3.1	3.4	6.5
UDLIHP	85.4	53.3	138.7
LGIIP	147.9	44.3	192.2
එකතුව	**252.4**	**105.7**	**358.1**

මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය



(රූප සටහන් අංක 1.6) ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

LLDF - දේශීය ණය සහ සංවර්ධන අරමුදල
PCDP - බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත්කළ ණය මුදල්
UDLIHP - නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
LGIIP - පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මහා භාණ්ඩාගාරය වෙත ණයඅපසු ගෙවීම් 2019 - 2023 (වගු අංක 1.9)

වර්ෂය	වාරික				පොළිය				මුළු එකතුව රු. මිලි.
	LLDF	PCDP	UDLIHP	LGIIP	LLDF	PCDP	UDLIHP	LGIIP	
2019	21.1	2.3	90.8	80.6	10.3	4.2	76.2	43.9	329.4
2020	20.6	2.5	87.7	121	8.8	4	78.3	47.4	370.3
2021	18.3	2.8	88.6	146.2	7.2	3.8	66.6	48.5	382
2022	17.1	3.1	126.8	147.9	5.9	3.5	89.3	46.5	440.1
2023	16	3.1	85.4	147.9	4.7	3.4	53.3	44.3	358.1
එකතුව	93.1	13.8	479.3	643.6	36.9	18.9	363.7	230.6	1879.9

ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

LLDF	දේශීය ණය සහ සංවර්ධන අරමුල මගින් නිකුත් කළ ණය
PCDP	බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත්කළ ණය මුදල්
UDLIHP	නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
LGIIP	පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය



මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් - 2019 –2023 (වගු අංක 1.10)

දේශීය ණය සහ සංවර්ධන අරමුදල(LLDF)

වර්ෂය	වාරික රු. මිලියන	පොළිය රු. මිලියන
2019	21.1	10.3
2020	20.6	8.8
2021	18.3	7.2
2022	17.1	5.9
2023	16	4.7
එකතුව	93.1	36.9

බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP)


වර්ෂය	වාරික රු. මිලියන	පොළිය රු. මිලියන
2019	2.33	4.2
2020	2.5	4
2021	2.8	3.8
2022	3.1	3.5
2023	3.1	3.4
එකතුව	13.83	18.9


නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP)


වර්ෂය	වාරික රු. මිලියන	පොළිය රු. මිලියන
2019	90.8	76.2
2020	87.7	78.3
2021	88.6	66.6
2022	126.8	89.3
2023	85.4	53.3
එකතුව	479.3	363.7


පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP)

වර්ෂය	වාරික ගෙවීම් රු. මිලියන	පොළී ගෙවීම් රු. මිලියන
2019	80.6	43.9
2020	121	47.4
2021	146.2	48.5
2022	147.9	46.8
2023	147.9	44.3
එකතුව	643.6	230.9









(රූප සටහන් අංක 1.7) ප්‍රභවය: දේ.ණ.සං.අ. මුදල් පොත 2023

වර්තමාන ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ පණිවිඩය (සභාපති)




රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ දැනට පාලනය වන දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2023 වසරේ වාර්ෂික වාර්තාවට පණිවිඩයක් ලබාදීමට ලැබීම සම්බන්ධයෙන් මා ඉතාම සතුටු වෙමි.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 1916 අංක 22 දරණ ආඥා පනත යටතේ එවකට පාලකයන් විසින් පැවති පළාත් පාලන ආයතන වන සනීපාරක්ෂක මණ්ඩල ගම් සභා, සුළු නගර සභා, නගර සභා සහ මහ නගර සභා යන නගර සභා ද ඉන් පසුව ඇතිවූ පළාත් පාලන ආයතන සහ සමූපකාර සමිති සඳහා මූල්‍ය පහසුකම් සැලසීම සඳහා පිහිටුවා ඇති ආයතනයකි. එකල අප රටේ මූල්‍ය ආයතන බැංකු ආදිය බහුලව ක්‍රියාත්මක නොවූ බැවින් මෙම ආයතනය පළාත් පාලන ආයතනවලට සහ සමූපකාර ව්‍යාපාරයට මූල්‍ය පහසුකම් සහනදායී ක්‍රමයට ලබාදී ඇත. පසුකාලීනව සමූපකාර ව්‍යාපාරය සඳහා ණය පහසුකම් ලබාදීම සඳහා බොහෝ ආයතන ඇතිවූ බැවින් දේශීය ණය සහ සංවර්ධන අරමුදල පළාත් පාලන ආයතනවලටම පමණක් මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා ක්‍රියාත්මක වී ඇත.

මෙම ආයතනයේ කොමසාරිස් මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් මා මීට පෙර දෙවතාවක් බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් වශයෙන් සේවය කරන අවධියේ දායක වී ඇත. වර්තමානයේ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් නිල බලයෙන් මා මෙම ආයතනයේ සභාපති පදවියට

2024.01.01 දින සිට පත්ව ඇත. 2023 වසරේ මා සහභාගී වූයේ කොමසාරිස් මණ්ඩල සාමාජිකයෙකු වශයෙනි. මෙම කාල පරිච්ඡේදය තුල මෙම ආයතනයේ පරිපාලන මූල්‍ය සහ සංවර්ධන කාර්ය භාරය වඩාත් වැඩිදියුණු වී ඇති බව මා මෙහිලා සඳහන් කරන්නේ මහත් සන්තෝෂයෙනි. ජාතික ආර්ථිකයට වැදගත් වන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සහ දෙනු ලබන ණය මුදල් ප්‍රමාණය වැඩිකිරීම සහ ලබාදී ඇති ණය මුදල්වල වසර ගණනාවක් තිස්සේ අක්‍රීයව පැවති ණය අයකර ගැනීමට හැකිවීම වැනි අංශවල විශාල ප්‍රගතියක් ඇති බව මා සඳහන් කරන්නේ ආඩම්බරයෙනි. මෙම ආයතනය දියුණු කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ගරු අග්‍රාමාත්‍යවරයාගෙන් ලැබුණු සහයෝගය ද කොමසාරිස් මණ්ඩලයේ සියළුම සාමාජිකයින්ගෙන් ලැබුණු සහයෝගය ද සියළුම පළාත්වල ප්‍රධාන ලේකම්වරුන් සහ පළාත් පාලන කොමසාරිස්වරුන්ගෙන් ලැබුණු සහයෝගය ද පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ගෙන් ලැබුණු සහයෝගය ද දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වර්තමාන අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී කේ.ඩී.චිත්‍රපාල මහතා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ද ලැබුණු සහයෝගය ද මේ මොහොතේ අතිශය අගය කොට සලකන අතර ඒ සඳහා මාගේ කෘතඥතාවය පලකරමි.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ඉදිරි කටයුතු සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථකවී පළාත් පාලන ආයතනවලට මූල්‍ය පහසුකම් සපයන ප්‍රමුඛ ආයතනය බවට පත් වේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.



ඩබ්ලිව්.වී.ප්‍රදිප් යසරත්න

සභාපති

වර්තමාන අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ඒ ඒ ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සහ ආදායම් උත්පාදනය වැඩිදියුණු කිරීම සඳහා වූ මහජන උපයෝගී සේවා වැඩිදියුණු කර, එම බල ප්‍රදේශවල සිටින ජනතාවගේ සුඛ විහරණය සඳහා දියත් කරන ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම්, සහන පොළී මුදලකට සහ නම්‍යශීලී කොන්දේසි යටතේ ලබාදීම සඳහා පිහිටුවා ඇති ආයතනය වන, දැනට රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වන දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2023 වසරේ මෙහෙයුම් සහ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ වාර්ෂික වාර්තාවට පණිවිඩයක් ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් සේ සලකමි.

තිඹිරිගේ සිට සොහොන් බිම දක්වා වූ මානව ක්‍රියාකාරකම්හිදී ජනතාවගේ සුඛ විහරණය සඳහා අවශ්‍ය භෞතික, මානසික හා ආධ්‍යාත්මික පහසුකම් වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මහ නගර සභා 24 ක් නගර සභා 41 ක් සහ ප්‍රාදේශීය සභා 276 ක් එකතුව පළාත් පාලන ආයතන 341 ක් මහජන සේවය සඳහා කැපවී සිටී. එම පළාත් පාලන ආයතන විසින් මහජන සුඛ විහරණය සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා යටත් විජිත සමයේ සිට එනම් 1916 වසරේ සිට එම වසරේ අංක 22 දරණ පාර්ලිමේන්තු ආඥා පනත යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල පිහිටුවා ඇත. ඒ අනුව පළාත් පාලන ආයතනවල මහජන සේවා ඉටුකිරීම සඳහා සහාය වීම සඳහා මෙම අරමුදල වසර 107 ක් තිස්සේ විශාල සේවාවක් ලබාදී ඇත. පළාත් පාලන ආයතනවල ඉදිකරනු ලබන මංමාවත්, ජල ව්‍යාපෘති, වෙළෙඳපොල ව්‍යාපෘති, සතිපොල ව්‍යාපෘති, පොදු වෙළඳපොළ ව්‍යාපෘති, කඩ සාප්පු ඉදිකිරීමේ ව්‍යාපෘති, ආදාහනාගාර ඉදිකිරීමේ ව්‍යාපෘති, පුස්තකාල ඉදිකිරීමේ ව්‍යාපෘති, කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති මහජනතාවගේ සෞඛ්‍ය සේවා සනීපාරක්ෂාව ඇතිකිරීම සඳහා කසල එකතු කිරීම සඳහා වාහන සහ ඊට අදාළ යන්ත්‍ර සූත්‍ර ලබාදීමේ ව්‍යාපෘති කසල ව්‍යාපෘති, ක්‍රීඩාංගන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සහ පුනර්ජනනීය බලශක්ති උත්පාදක ව්‍යාපෘති සඳහා මේ වනවිට සහන ණය පහසුකම් ලබාදී ඇත.

දැනට පළාත් පාලන ආයතනවල කාර්යාල, සතිපොළ, ක්‍රීඩා පිටි සහ අනෙකුත් ස්ථාන වලට වැයවන විදුලි බිල විශාල මුදලක් වන බැවින් රටේ විදුලි සැපයුම සහ මිල පිළිබඳ ජාතික වශයෙන් ගැටළුකාරී තත්වයක් ඇති බැවින් විදුලිය උත්පාදනය කිරීම සඳහා වූ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘති වලට අඩු පොළියට සහන ණය යෝජනා ක්‍රම


හඳුන්වා දෙමින් එකී ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වයක් ලබාදීමට අප ආයතනයේ කොමසාරිස් මණ්ඩලය මේ වන විට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන පළාත් පාලන ආයතනවල එකී ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් සඳහා මූල්‍ය පහසුකම් ලබාදී ඇති අතර එයින් එම ආයතනවල විදුලි බිල ශූන්‍ය කිරීමත් එයින් ජාතික විදුලිබල පද්ධතියට අතිරේක විදුලි ඒකක ප්‍රමාණයක් එකතු කිරීම තුලින් පළාත් පාලන ආයතනවලට ආදායමක් ලබාගැනීමටත් හැකිවන පරිදි කටයුතු කර ඇත.

2023 වසර තුල දේශීය ණය සහ සංවර්ධන අරමුදල විසින් ඉදිරි පියවර රැසක් ගෙන ඇත. එනම් 2024-2028 පස් වසර සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලට <u>ව්‍යාපාර සැළැස්මක්</u> සකස් කර ක්‍රියාත්මක කරනු ලැබීමට පියවර ගෙන ඇති අතර එම ව්‍යාපාර සැළැස්ම පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාකර ඔවුන්ගේ යෝජනා අනුව සකස්කර ඇත. එමෙන්ම ණය ලබාදීම සම්බන්ධයෙන් <u>මූල්‍ය ක්‍රියා පටිපාටි සංග්‍රහය</u> සහ ආයතනයේ <u>මූල්‍ය හා පරිපාලන කටයුතු සඳහා මූල්‍ය හා ගිණුම් පිළිබඳ කාර්ය පටිපාටි සංග්‍රහයක්</u> කෙටුම්පත් කර ඉදිරිපත් කර ඇත. මෙම කාර්ය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් කිසිදු මුදලක් වැය නොකල අතර ඒ සඳහා ආසියානු පදනම අප වෙත මූල්‍ය සහ තාක්ෂණ සහාය ලබාදීමට ක්‍රියාකර ඇති බැවින් ආසියානු පදනමට මේ අවස්ථාවේ ස්තූතිය පළ කිරීමටත් මා බලාපොරොත්තු වෙමි.

තවද සේවක සංඛ්‍යාව තීරණය කිරීමත් බඳවා ගැනීමේ පටිපාටි සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවාගෙන ඇති අතර මෙතෙක් අභ්‍යන්තර විගණන කාර්යය මෙම ආයතනයේ සිදු නොවූ අතර ඒ සඳහා තනතුරක් හෝ නිලධාරියකු නොසිටි බවත් අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර ඇතිකර ඒ සඳහා වැඩ බැලීමට කෙනෙකු පත්කර ඇති බවත් ආයතන මට්ටමින් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ඇති බවත් සඳහන් කරන්නේ මහත් සතුටිනි. එමෙන්ම 2023 වසරේ අගභාගයේදී නව ණය යෝජනා ක්‍රම ගණනාවක් සූර්ය බලශක්ති, සිටි ලින්ක්, නිසල අරණ, දැනුම ආදී ණය යෝජනා ක්‍රම සකස්කර පළාත් පාලන ආයතනවලට හඳුන්වාදීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයක් ලෙස සලකමි. අනුමත කාර්ය මණ්ඩලය 45 දෙනෙකුගෙන් යුක්ත වූවද මෙම සියළු කාර්යන් කරනු ලබන්නේ දැනට සිටින කාර්ය මණ්ඩලයේ 30කින් පමණ වන අතර පළාත් පාලන ආයතනවලට ණය ලබා දීමට හෝ ආයතනයේ නිලධරීන්ට වැටුප් ගෙවීම ඇතුළු සියළු පරිපාලන වියදම් අප ආයතනය විසින්ම උපයාගෙන රාජ්‍ය භාණ්ඩාගාරයට කිසිම බරක් නොදී මෙම ආයතනය ස්වාධීනව පවත්වාගෙන යාමට ලැබීම රටේ පළාත් පාලන ක්ෂේත්‍රයට ඉතා වැදගත් ආයතනයක් මෙන්ම එවැනි ආයතනයක් මෙහෙයවීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයක් වශයෙන් ද හඳුන්වාදීමට හැකිය. 2023 ජූලි මස 27 දින මෙම ආයතනයට මා පත්වූ අවස්ථාවේ සිට ඉහත සඳහන් කාර්යයන්ට අමතරව අප ආයතනයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ එකම මණ්ඩලය වන කොමසාරිස් මණ්ඩලය මාසිකව රැස්කර සෑම මසකම කොමසාරිස් මණ්ඩල රැස්වීම් පවත්වා තීරණ ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමටත්, විධිමත් කිරීමටත් මට හැකි විය.

2023 වසරේ විවිධ පරිපාලන හේතු මත ණය මුදල් ලබාදීමේ ප්‍රමාණය අඩු වුවද 2023 වසරේදී අප විසින් ස්ථාපිත කරන ලද අඩිතාලම අනුව 2024 වසරේ එකවර රු.මිලියන 1230 ක් වටිනාකම ඇති පළාත් පාලන ආයතන 45ක් මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 50කට ණය මුදල් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයක් කොට සලකමි. එම ණය මුදල් වලින් වැඩි ප්‍රමාණයක් එනම් ව්‍යාපෘති 30 ක් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වීමද ව්‍යාපෘති 07 ක් ආදාහනාගාර ව්‍යාපෘතිවීමද කැපී පෙනෙන ලක්ෂණයක් බව අප විසින් නිරීක්ෂනය කර ඇත.

මෙම සියළු කාර්යයන් තුලින් 2023 වසරේ අප ආයතනයේ පරිපාලන මූල්‍ය හා සංවර්ධන කටයුතු වලට අත්තිවාරමක් දැමීමට හැකිවූ බව මගේ විශ්වාසයයි. මෙම කාර්යයන් තනිවම කල නොහැකි කාර්යයන් ලෙසත් මෙහෙයවීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ සභාපති හා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ප්‍රදීප් යසරත්න මැතිතුමාගෙන්ද එම වසරේ ඊට පෙර සිටි සභාපතිතුමන්ගෙන්ද කොමසාරිස් මණ්ඩලය නියෝජනය කරන පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්, පළාත් පාලන කොමසාරිස්වරුන් සහ අනෙකුත් කොමසාරිස් මණ්ඩල සාමාජිකයින්ගෙන් ලැබුණ සහයෝගය ප්‍රශංසනීය බව මේ අවස්ථාවේ සටහන් කිරීම මගේ යුතුකමක් සේ සලකමි. තවද මෙම ආයතනය කුඩා ආයතනයක් වූවද මෙම අවස්ථාවේ මෙම ආයතනයේ ප්‍රගතිය පිළිබඳ වරින් වර විමසුම් කරමින් ගරු අමාත්‍යතුමා විසින් පසු විපරම් කිරීම තුල අප ධෛර්යමත් කළ බැවින් එතුමාට මේ අවස්ථාවේදී කෘතඥපූර්ව ස්තූතිය පිරිනමමි. මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ සියළුම නිලධාරී මණ්ඩලයත් අප සමඟ කටයුතු කළ පළාත් පාලන ආයතවල කොමසාරිස්වරු සහ ලේකම්වරු ආසියානු පදනම සහ එහි නිලධාරීන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ආදී සියළු දෙනාටම මේ අවස්ථාවේ මගේ ස්තූතිය පිරිනමන අතර පළාත් පාලන ආයතන විසින් කරනු ලබන මහජන උපයෝගී සේවා සඳහා තව තවත් මූල්‍ය පහසුකම් ලබා දීමට දේශීය ණය සහ සංවර්ධන අරමුදලට හැකියාව හා ශක්තිය ලැබේවායි මා ප්‍රාර්ථනා කරමි.




කේ.ඩී.චිත්‍රපාල
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

ජයග්‍රහණ හා ඉස්මතු කිරීම් (Highlights)

සාර්ථක වූ ව්‍යාපෘති

Shopping Complex

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව



මුළු ව්‍යාපෘති පිරිවැය
රු. මිලි 1,275
ලබා දුන් ණය ප්‍රමාණය
රු. මිලි 500
කාලය
(2014 – 2020)



Development of Conference Hall

පස්බාගෙ කොරළේ ප්‍රාදේශීය සභාව



මුළු ව්‍යාපෘති පිරිවැය
රු. මිලි 4.1
ලබා දුන් ණය ප්‍රමාණය
රු. මිලි 3.2
කාලය
(2022)



Solar Power Projects

මහරගම නගර සභාව



මුළු ව්‍යාපෘති පිරිවැය
රු. මිලි 11
ලබා දුන් ණය ප්‍රමාණය
රු. මිලි 8.8
කාලය
(2022)



Rest House

කැස්බෑව නගර සභාව



මුළු ව්‍යාපෘති පිරිවැය
රු. මිලි 61
ලබා දුන් ණය ප්‍රමාණය
රු. මිලි 30
කාලය
(2019 - 2020)



Community Water Supply Project

කරුවෙළගස්වැව ප්‍රාදේශීය සභාව



මුළු ව්‍යාපෘති පිරිවැය
රු. මිලි 28.4
ලබා දුන් ණය ප්‍රමාණය
රු. මිලි 17
කාලය
(2020 - 2021)



Shopping Complex

නුවර මහ නගර සභාව



මුළු ව්‍යාපෘති පිරිවැය
රු. මිලි 1500
ලබා දුන් ණය ප්‍රමාණය
රු. මිලි 1000
කාලය
(2018 - 2021)



Crematorium

හෝමාගම ප්‍රාදේශීය සභාව




මුළු ව්‍යාපෘති පිරිවැය
රු. මිලි 12
ලබා දුන් ණය ප්‍රමාණය
රු. මිලි 8.5
කාලය
(2008 - 2010)



පුස්තකාල ගොඩනැගිල්ල
මීගමුව මහ නගර සභාව



මුළු ව්‍යාපෘති පිරිවැය
රු. මිලි 368
ලබා දුන් ණය ප්‍රමාණය
රු. මිලි 286
කාලය
(2016 - 2024)



ඉස්මතු කිරීම

පළාත් පාලන ආයතන ප්‍රධානීන් සමඟ ප්‍රමුඛ සංවර්ධන ක්ෂේත්‍රවල ව්‍යාපෘති හඳුනාගැනීමේ වැඩසටහන




අග්‍රාමාත්‍යතුමන් කොමසාරිස් මණ්ඩලය සමඟ ප්‍රගතිය සමාලෝචන කිරීමේ රැස්වීම




2024-28 කාලය සඳහා ව්‍යාපාර සැලැස්ම පිළියෙල කිරීම සඳහා පාර්ශව කරුවන් සමඟ කරන ලද වැඩමුළුව





කළමනාකරණ සාකච්ඡා හා අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් වටිනාකම් නිර්මාණය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා සංවිධානවලට සහය වන්නේ කෙසේ ද සහ එහි ප්‍රතිපලයක් වශයෙන් ආයතනික අරමුණු සාක්ෂාත් කරගන්නේ කෙසේ ද යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම මෙහි බලාපෙරොත්තුවයි.

අවාසනාවන්ත සිදුවීම්වල සම්භාවිතාව හෝ බලපෑම් අවම කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා සම්පත් සම්බන්ධීකරණය හා ආර්ථික වශයෙන් යෙදවීමෙන් පසුව අවදානම් හඳුනාගැනීම, ඇගයීම හා ප්‍රමුඛතාවය ලබාදීම හෝ අවස්ථාවන් සාක්ෂාත් කර ගැනීම උපරිම කිරීමයි.



අවදානම් කළමනාකරණයේ පියවර Steps of Risk Management

- අවදානම් කළමනාකරණය සැලසුම් කිරීම හා අවදානම් හඳුනා ගැනීම (Planning of risk Management and Identification of Risk)
- අවදානම් විශ්ලේෂණය කිරීම (Analyzing of Risk)
- අවදානම් ඇගයීම (Evaluation of Risk)
- අවදානම් ප්‍රතිකර්ම සැලසුම් කිරීම (Planning of Risk Treatments)
- සන්නිවේදනය හා උපදේශනය (Communication and Consultation)
- පටිගත කිරීම හා වාර්තා කිරීම (Recording and Reporting)
- අධීක්ෂණය හා සමාලෝචනය (Monitoring and Reviewing)

අවදානම් කළමනාකරණය සැලසුම් කිරීම හා අවදාවම් හඳුනා ගැනීම (Planning of risk Management and Identification of Risk)

අවදානම් හඳුනාගැනිම ක්‍රමානුකූල හා විධිමත් ක්‍රියාවලියකි. එය වඩාත්ම සුදුසු වන්නේ කණ්ඩායම් පරිසරයක් තුල සිදු කිරීමයි. මෙම ක්‍රියාවලිය තුල පුද්ගලයින් රැසකගේ පුළුල් සහභාගිත්වයෙන් වේ. එනම් ඉහළ දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල නිලධාරීන් හා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස්වරුන්, සභාපති ඇතුළු විධායක නිලධාරීන්, නිලධාරීන් හා සේවකයින් සහභාගි කර ගනු ලැබේ.

අවදානම් හඳුනා ගන්නා ආකාර

- කමිටු රැස්වීමේ විවිධ අවදානම් හඳුනා ගැනීම.
- පැමිණිලි මඟින් අවදානම් හඳුනා ගැනීම.
- SWOT ඇගයීමේ ක්‍රමය භාවිතා කර අවදානම් හඳුනා ගැනීම



ශක්තීන්

- ණය සැපයීම සඳහා විශාල අරමුදලක් පැවතීම.
- අරමුදල මෙහෙය වනු ලබන්නේ ප්‍රධාන ලේකම්වරුන් සහ පළාත් පාලන කොමසාරිස්වරුන්ගෙන් සමන්විත මණ්ඩලයක් විසිනි.
- දේ.ණ.සහ සං.අර. පනතින් සහ රජයේ රෙගුලාසි මඟින් ආරක්ෂා වීම.
- සහන පොළී අනුපාතවලට ණය සැපයිය හැකි වීම.
- ණය හා සේවා සැපයීමට විශේෂිත වූ පාරිභෝගින් පිරිසක් නම් කර තිබීම.
- පළාත් පාලන කොමසාරිස්වරුන් හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මඟින් ව්‍යාපෘති සාර්ථකව අධීක්ෂණය කළ හැකිවීම.
- අරමුදලේ නිල බලයෙන් සභාපති අමාත්‍යාංශ ලේකම් වීම.
- අරමුදලක් වශයෙන් පැවතීම නිසා අනුපාතවලට වඩා අඩු පොලී අනුපාතවලට ණය දීමට හැකි වීම

දුර්වලතා

- අනුමත කාර්ය මණ්ඩලය 46ක් වන අතර 2023.12.31 වන විට එයින් 13ක් පුරප්පාඩු වීම හා ප්‍රමාණවත් වෘත්තීය කාර්ය මණ්ඩලයක් නොමැති වීම.
- ප්‍රධාන කාර්යාලය සඳහා විශාල කුළී මුදලක් ගෙවීම.
- දේ.ණ.සං.අමු.ණය සැපයීම පළාත් පාලන ආයතන සඳහා පමණක් සීමා කිරීම.
- නිදහස් ප්‍රාග්ධන වෙළඳපල ක්‍රියාකාරම් සීමා කර තිබීම.
- සැලකිය යුතු ණය අවදානම් අනුපාතයක් පැවතීම.
- කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධනය ප්‍රමාණවත් නොවීම.
- අරමුදලට අයිති කාර්යාල දේපලක් නොමැති වීම.
- අරමුදලේ පරිගණක පද්ධතිය දුර්වල වීම.

S W O T

අවස්ථා

- පනත සංශෝධය කර කාර්යභාරය පුළුල් කර ගත හැකි වීම.
- භාණ්ඩාගාරයෙන් අඩු පිරිවැය යටතේ අරමුදල් සපයා ගත හැකිය.
- පළාත් පාලන ආයතන ආදායම් උපයන ව්‍යාපෘති සඳහා ණය ලබා ගැනීමේ නව ප්‍රවනතාවක් ඇති වී තිබීම.
- පළාත් පාලන ආයතන සඳහා සහන පොළී අනුපාතයට ණය ලබා ගත හැකි ආයතන ප්‍රමාණය අඩුවීම නිසා තරහකාරිත්වය අඩු වීම.
- ණය ලබා දි හැකි ක්ෂේත්‍ර පුළුල් කළ හැකි වීම.


තර්ජන

- අභ්‍යන්තර පාලනයන්හි ඇති ආවේනික සීමාවන්.
- ආර්ථික අවපාතය නිසා මුදලේ අගය අඩු වීම.
- යල්පැන ගිය නෛතික සහ නියාමන අවශ්‍යතා පැවතීම.
- රජය හා පරිත්‍යාගශීලීන් විසින් පළාත් පාලන ආයතනවලට නොමිලේ අරමුදල් බෙදා හැරීම.
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල පිළිබඳව ඇති අවබෝධය අඩු වීම.

අවදානම් ප්‍රතිකර්ම සැලසුම් කිරීම (Planning of Risk Treatments)

නිසි අවදානම් කළමනාකරණයට අවදානම් ප්‍රතිකර්ම පිළිබඳ තාර්කික හා දැනුවත් තීරණ අවශ්‍ය වේ. සාමාන්‍යයෙන් එවැනි ප්‍රතිකර්මවලට ඇතුලත් වන්නේ අවදානම ඇති වන ක්‍රියාකාරකම් වලක්වා ගැනීම, අවදානම් බෙදා ගැනීම, පාලනයක් යෙදීමෙන් අවදානම් කළමනාකරණය කිරීම, අවදානම් පිලිගැනීම හා ඉදිරි ක්‍රියා මාර්ග නොගැනීම හෝ අවස්ථාවන් ලබා ගැනීම සඳහා අවදානම් බාර ගැනීමයි.

අවදානම් ප්‍රතිකර්ම



දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අවදානම් කලමණාකරනය

හැඳින්වීම

සිය මූල්‍ය උපකරණ භාවිතා කිරීමේදී අරමුදල පහත අවදානම්වලට නිරාවරණය වේ.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදනාම
- වෙළඳපල අවදානම

මේ සටහන මගින් අරමුදලේ එකිනෙක අවදානමට නිරාවරණය වීම, අරමුදලේ අරමුණු, ප්‍රතිපත්ති සහ අවදානම් මැනීම සහ කලමණාකරනය පිලිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ.

ණය අවදානම

ණය අවදානම යනු පාරිභොගිකයකු හෝ මූල්‍ය උපකරණයන්ට සම පාර්ශවයක් සිය ගිවිසුම් ගත බැඳීම් ඉටුකිරීමට අසමත් වීම හේතුවෙන් අරමුදලට සිදුවන මූල්‍ය හානියකි. ප්‍රධාන වශයෙන්ම ණය අවදානමක් හටගනුයේ ලැබිය යුතු ණය සම්බන්ධයෙන් අරමුදලට ලැබිය යුතු දෑ සහ බැංකු සහ මූල්‍ය ආයතන වෙතැති තැන්පතු සම්බන්ධයෙනි.

ණය වටිනාකම් ඇගයුම සහ පිරිනමනු ලබන ණය කාලීන සමාලෝචනයට ලක් කිරීම මගින් ණය අවදානම කළමනාකරනය කරනු ලබයි.

අරමුදල ණය සහ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් ලැබිය යුතු වන දෑ සම්බන්ධව සිදු වන හානි පිලිබඳ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනා අපහායනයන් උදෙසා වන දීමනාවක් ස්තාපිත කරයි. හානි සිදුවීම හට ගෙන ඇති එහෙත් හඳුනාගෙන නැති අවස්ථාවන් හිදී ව්‍යාපෘති පදනමින් සමාන ලැබිය යුතු දෑ වෙනුවෙන් ණය අවදානම වෙනුවෙන් ස්ථාපිත සාමූහික අපහායනය උදෙසා වන දීමනාවකින් අරමුදලේ අපහායන ප්‍රතිපත්තිය සමන් විත වේ. මේ සාමූහික අපහායනය තීරණය කරනු ලබන්නේ සමාන මූල්‍ය වත්කම් සඳහා ගෙවුම් සංඛ්‍යා ලේඛණයන් හී ඓතිහාසික දත්ත මත පදනම්වය.

අමතර ඇප සහ ණය ඉහල දැමීම්හී සාධාරණ අගය (වගු අංක 4.1)

අරමුදලේ අමතර ඇප සහ ණය ඉහල දැමීම් හී සාදාරණ අගය පහත වගුවෙන් දැක්වේ.

2023 දෙසැම්බර්31 දිනට	2023		2022	
	ණය අවදානමට උපරිම නිරාවරණය වීම	ශුද්ධ නිරාවරණය වීම	ණය අවදානමට උපරිම නිරාවරණය වීම	ශුද්ධ නිරාවරණය වීම
	රු	රු	රු	රු
මුදල් සහ මුදල් සමාන දෑ	96,667,455	96,667,455	121,162,801	121,162,801
බැංකු සහ මූල්‍ය ආයතනයන්හී ශේෂය	685,058,333	685,058,333	598,000,000	598,000,000
ණය සහ ලැබිය යුතු දෑ	2,865,193,520	2,865,193,520	3,264,343,263	3,264,343,263
වෙනත් මූල්‍ය වත්කම්	103,535,383	103,535,383	99,691,917	99,691,917
	3,750,454,691	3,750,454,691	4,083,197,980	4,083,197,980

ප්‍රභවය: දේ.ණ.සං.අ. මූල්‍ය ප්‍රකාශ 2023

මූල්‍ය වත්කම්හී පංතිය අනුව ණය තත්වය (වගු අංක 4.2)

		ලැබිය යුතු කල්ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද	ලැබිය යුතු කල්ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද	තනි තනිව අපහායනය කරනලද	එකතුව
a)	**2023 දෙසැම්බර්31 දිනට**	රු	රු	රු	රු
	වත්කම්				
	මුදල් සහ මුදල් සමාන දෑ	96,667,455			96,667,455
	බැංකු ශේෂ	685,058,333			685,058,333
	ණය සහ ලැබිය යුතු දෑ	2,865,193,520	559,172,766	1,054,949,957	4,479,316,243
	වෙනත් වත්කම්	103,535,383			103,535,383
	මුළු මූල්‍ය වත්කම් එකතුව	**3,750,454,691**	**559,172,766**	**1,054,949,957**	**5,364,577,414**

		ලැබිය යුතු කල්ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද	ලැබිය යුතු කල්ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද	තනි තනිව අපහායනය කරනලද	එකතුව
b)	**2022 දෙසැම්බර්31 දිනට**	රු	රු	රු	රු
	වත්කම්				
	මුදල් සහ මුදල් සමාන දෑ	121,162,801			121,162,801
	බැංකු ශේෂ	598,000,000			598,000,000
	ණය සහ ලැබිය යුතු දෑ	3,150,830,065	426,881,658	906,166,187	4,597,391,109
	වෙනත් වත්කම්	99,691,917			99,691,917
	මුළු මූල්‍ය වත්කම් එකතුව	**4,083,197,981**	**426,881,658**	**906,166,187**	**5,416,245,826**

ප්‍රභවය: දේ.ණ.සං.අ. මූල්‍ය ප්‍රකාශ 2023

ද්‍රවශීලතා අවදානම

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් යෙදවීම මගින් පියවනු ලබන මූල්‍ය වගකීම් හා බැඳුනු බැඳීම් සම්පූර්ණ කිරීමට යාමේදී අරමුදලට ඇතිවන අවදානම ද්‍රවශීලතා අවදානම නම් වේ.

ද්‍රවශීලතා අවදානම කළමණාකරනය කිරීම සඳහා දේ.ණ.ස.සං.අරමුදල සියළු මූල්‍ය උපකරණයන් පිලිබඳ කල්පිරුම් විශ්ලේෂණය භාවිතා කරයි.

(අ) ද්‍රවශීලතා අවදානමට නිරාවරණය වීම

සිය ප්‍රධාන අරමුදල් සම්පාදන මූලාශ්‍රය ලෙස අරමුදල ණය ගැනීම් කෙරේ විශ්වාසය තබයි. තරගකාරී මිල ගණන් පවත්වා ගැනීම සහ වෙළඳපල ප්‍රවණතා පිලිබඳ අනුවර්ත අධීක්ෂණය මගින් අරමුදල සක්‍රීයව අවදානම කළමණාකරනය කරයි.

(ආ) ද්‍රවශීලතා අවදානම කළමණාකරනය කිරීම

ද්‍රවශීලතා කළමණාකරනය පිණිස අරමුදලේ ප්‍රවේශය වනුයේ අරමුදල් සම්පාදකයන් සමග වන ණය ගිවිසුම් සහ නියාමන අවශ්‍යතා නිතිපතා පවත්වාගනෙ යන අතර අරමුදලේ

මූල්‍ය තත්වය අවදානමේ නොහෙලා නැතිනම් අනවශ්‍ය හානි සිදු නොවන බවට වගබලා ගනිමින් අවශ්‍ය වනපරිදි ප්‍රමාණවත් ද්‍රවශීලතාවන් තිබෙන බවට වගබලා ගැනීමයි.

වට්ටම් රහිත දළ පිටතට ගලා යාම් මත පදනම්ව මූල්‍ය වගකීම් පිලිබඳ කල්පිරීම් විශ්ලේෂණය

(වගු අංක 4.3)

අ)	2023 දෙසැම්බර් 31 දිනට	ඉදිරියට ගෙනා වටිනාකම	දළ නාමික පිටතට ගලා යාම්	ඉල්ලුම මත	මාස 3 දක්වා	මාස 3 සිට 12 දක්වා	වසරකට වැඩි
	පොලී සහිත ණය ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු	4,015,006,605	4,119,745,603	-	-	346,720,080	3,773,025,522
	වෙනත් වගකීම්	48,345,271	48,345,271	-	451,759	406,410	47,487,102
		4,063,351,876	**4,168,090,874**	**-**	**451,759**	**347,126,490**	**3,820,512,625**

ආ)	2022 දෙසැම්බර් 31 දිනට	ඉදිරියට ගෙනා වටිනාකම	දළ නාමික පිටතට ගලා යාම්	ඉල්ලුම මත	මාස 3 දක්වා	මාස 3 සිට 12 දක්වා	වසරකට වැඩි
	පොලී සහිත ණය ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු	4,263,982,469	4,368,721,467	-	-	346,720,080	4,022,001,386
	වෙනත් වගකීම්	7,811,220	7,811,220	-	252,423	318,000	7,240,797
		4,271,793,689	**4,376,532,687**	**-**	**252,423**	**347,038,080**	**4,029,242,184**

ප්‍රභවය: දේ.ණ.සං.අ. මූල්‍ය ප්‍රකාශ 2023

වෙළඳපල අවදානම (වගු අංක 4.4)

වෙළඳපල අවදානම යනු මූල්‍ය ආයතනයක අනාගත මුදල් ප්‍රවාහයන් හී සාධාරණ අගය වෙළඳපල මිල ගණන් වෙනස් වීම මත උච්ඡාවචනය වීමේ අවදානමයි.

අරමුදලේ මෙකී වෙළඳපල අවදානම ප්‍රධාන වශයෙන්ම සමන්විත වනුයේ පොලී අනුපාත අවදානම සහ මුදල් අවදානම මගිනි. වෙළඳපල අවදානම කළමණාකරනය කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ ලාභය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගනිමින් පිලිගත හැකි පරාමිතීන් තුළ අවදානම් සඳහා නිරාවරණය වීමේ ඉඩ කළමණාකරනය සහ පාලනය කිරීමයි.

පහත වගුව මගින් වෙළඳ නොවන මූල්‍ය වත්කම් සහ වගකීම් මත අරමුදලේ පොලී අනුපාත අවදානම් නිරාවරණය විශ්ලේෂණය කිරීමයි. අරමුදලේ වත්කම් සහ වගකීම් ඉදිරියට ගෙනා වටිනාකම් තුළ ඇතුලත්වන අතර ගිවිසුම්ගත ප්‍රති මිලකරණය හෝ කල්පිරෙන දින මගින් වර්ගීකරණය කරනු ලැබේ.

(වගු අංක 4.4)

a)	2023දෙසැම්බර් 31 දිනට	ඉල්ලුම මත	මාස 3 ට අඩු	මාස 4 සිට 12 දක්වා	වසර 1 සිට 5 දක්වා	2023 දෙසැම්බර්31 දිනට එකතුව
	පොලී ඉපයුම් වත්කම්					
	මුදල් සහ මුදල් සමාන දෑ	96,667,455	-	-	-	96,667,455
	බැංකු ශේෂ	-	685,058,333	-	-	685,058,333
	ණය සහ ලැබිය යුතු දෑ	-	85,955,806	257,867,417	2,521,370,298	2,865,193,520
	වෙනත් වත්කම්	-	-	103,535,383	-	103,535,383
	මුළු පොලී ඉපයුම් වත්කම්	**96,667,455**	**771,014,139**	**361,402,799**	**2,521,370,298**	**3,750,454,691**
	පොලී සහිත වගකීම්					
	පොලී සහිත ණය සහ ගැණුම් සහභාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ	-	-	241,981,083	3,773,025,522	4,015,006,605
	වෙනත් වගකීම්	-	451,759	406,410	47,487,102	48,345,271
	මුළු පොලී සහිත වගකීම්	-	**451,759**	**242,387,493**	**3,820,512,625**	**4,063,351,876**
	පොලී ඉපයුම් වත්කම් පොලී සහිත වගකීම් - ශුද්ධ වත්කම්/(වගකීම් අතර පරතරය	**96,667,455**	**770,562,380**	**119,015,307**	**(1,299,142,327)**	**(312,897,185)**

b)	2022 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුම මත	මාස 3 ට අඩු	මාස 4 සිට 12 දක්වා	වසර එකට වැඩි	2022 දෙසැම්බර් 31 දිනට එකතුව
	<u>පොලී ඉපයුම් වත්කම්</u>					
	මුදල් සහ මුදල් සමාන දෑ	121,162,801	-	-	-	121,162,801
	බැංකු ශේෂ	-	498,000,000	100,000,000	-	598,000,000
	ණය සහ ලැබිය යුතු දෑ	-	97,930,298	293,790,894	2,872,622,071	3,264,343,263
	වෙනත් වත්කම්	-	-	99,691,917	-	99,691,917
	මුළු පොලී ඉපයුම් වත්කම්	**121,162,801**	**595,930,298**	**493,482,810**	**2,872,622,071**	**4,083,197,980**
	<u>පොලී ඉපයුම් වගකීම්</u>					
	පොලී සහිත ණය ගැනුම් සහභාණ්ඩාගාරය ට ගෙවිය යුතු දෑ	-	-	241,981,083	4,022,001,386	4,263,982,469
	වෙනත් වගකීම්	-	252,423	318,000	7,240,797	7,811,220
	මුළු පොලී සහිත වගකීම්	-	**252,423**	**242,299,083**	**4,029,242,184**	**4,271,793,689**
	පොලී සහිත වත්කම් සහ පොලී සහිතවගකීම් අතර පරතරය	**121,162,801**	**595,677,875**	**251,183,727**	**(1,156,620,112)**	**(188,595,709)**

ප්‍රභවය: දේ.ණ.සං.අ. මූල්‍ය ප්‍රකාශ 2023

පොලී අනුපාත සංවේදීතාව (වගු අංක 4.5)


විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පවත්වා ගන්නා අනෙක් සියළු විචල්‍යයන් සමග පොලී අනුපාතයන්හි සිදුවිය හැකි සාධාරණ වෙනස්කම් පිලිබඳ සංවේදීතාව පහත වගුව මගින් ඉදිරිපත් කෙරේ.

	2023		2022	
	පොලී අනුපාතයේ වැඩිවීම/අඩුවීම	බදු වලට පෙර ලාභයට වන බලපෑම	පොලී අනුපාතයේ වැඩිවීම/අඩුවීම	බදු වලට පෙර ලාභයට වන බලපෑම
		රු		රු
පොලී අනුපාත	1%	9,643,084	1%	60,736,153
පොලී අනුපාත	-1%	(9,643,084)	-1%	(60,736,153)

ගතික ආයතන පරිසරය හදුනාගැනීම

PESTEL විශ්ලේෂණය භාවිතා කරමින් හදුනා ගැනීම කර ඇත.මෙහි දී බලපාන දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ප්‍රධාන සාධක නම් මෙහෙයුම් චක්‍රය කෙරෙහි බලපාන සාධක

- POLITICAL - දේශපාලන
- ECONOMIC - ආර්ථික
- SOCIAL - සමාජීය
- TECHNOLOGICAL - තාක්ෂණික
- ENVIRONMENTAL - පාරිසරික
- LEGAL ENVIRONMENT - නෛතික



දේශපාලන පරිසරය විශ්ලේෂණය

කිසියම් ආර්ථික හෝ ආර්ථික නොවන කටයුත්තකට හෝ ආයතනය කෙරෙහි කිසියම් රටක රජයක් දායක වන ආකාරය සහ දේශපාලනික තීරණ බලපෑම් කරන ආකාරය මෙයට අදාල වේ.

- රාජ්‍ය ප්‍රතිපත්ති - මහ බැංකුවේ ණය පොලී අනුපාතය ණය ලබා දෙන ක්ශේත්‍ර වෙනස් කිරීමට සිදු වේ.
- දේශපාලනික ස්ථාවරත්වය - සභාපති හා කොමසාරිස්වරුන් වෙනස් වීම පාලනයට බලපායි.

ආර්ථික පරිසරය විශ්ලේෂණය

රටක ක්‍රියාත්මක වන්නා වූ ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්වීම් ආයතනය කෙරෙහි බලපෑම් කරන ආකාරය මෙයට අදාල වේ.

- උද්ධමන අනුපාතය හා මිල මට්ටම ඉහළ යෑම නිසා අයවැය ඇස්තමේනතුවෙන් වෙන් කරන ලද (වියදම්) ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වියදම් සීමා කිරීමට සිදු වීම.
- ආයෝජනය කර ඇති ස්ථාවර තැන්පත්වල පොලී ආදායම අඩුවීම හේතුවෙන් ඇස්තමේන්තු කරන ලද ආදායම අඩු වීම. එම නිසා වියදම් සීමා කර වියදම් දැඩි ලෙස කළමනාකරණය කිරීමට සිදු විය.

සාමාජීය පරිසරය විශ්ලේෂණය

සාමාජීය හා සංස්කෘතික පරිසරාත්මක සාධකයක් ලෙස ද මෙය හැදින් වේ. පළාත් පාලන ආයතනවලට ණය ලබා දීමේ ක්ශේත්‍ර පරිසර හිතකාමී හා සමාජ සුභ සාධන ලෙස පුළුල් කිරීම.

තාක්ෂණික පරිසරය විශ්ලේෂණය

තාක්ෂණික විවිධ ක්‍රම හා ශිල්පීය ක්‍රමයන්ගේ වෙනස්වීම් මෙයට අදාල වේ. ආයතනයේ පරිපාලන කටයුතු හා ගිණුම්කරණ කටයුතු පහසු කිරීම සඳහා විවිධ තාක්ෂණික ක්‍රම භාවිතයට ගනු ලැබේ.

- තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා (ALLSHRING) භාවිතා කිරීම.
- අවසන් ගිණුම් සකස් කිරීමට අදාල මෘදුකාංගයක් මිලට ගැනීම.
- අභ්‍යන්තර ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම (Automation).
- ණය ලබා දීමේ සිට අය කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා නව මෘදුකාංගයක් මිලට ගැනීම.

පාරසරික පරිසරය විශ්ලේෂණය

පරිසර දූෂණය ඉලක්ක ඇති කර ගනිමින් ආයතනික කටයුතු, සමාජ වගකීම සහ තිරසාර බව මුල්කර ගනිමින් ක්‍රියාත්මක කිරීම මේ යටතට ගැනේ. පළාත් පාලන ආයතනවලට ණය ලබා දීමේ ක්ශේත්‍ර පරිසර හිතකාමී හා සමාජ සුභ සාධන ලෙස පුළුල් කිරීම.

නෛතික පරිසරය විශ්ලේෂණය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල සඳහා අදාල වන නීති රීති මේ යටතට ගැනේ. මේ අනුව ප්‍රධාන (සෘජු) වශයෙන් පහත නීති රීති පළාත් පාලන ආයතන සඳහා අදාල වේ

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1916 අංක 22 දරණ දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ආඥා පනතට ගෙන එනු ලැබූ පහත සඳහන් සංශෝධන
- 1930 අංක 06 දරණ ආඥා පනත
- 1931 අංක 25 දරණ ආඥා පනත
- 1938 අංක 43 දරණ ආඥා පනත
- 1942 අංක 21 දරණ ආඥා පනත
- 1946 අංක 29 දරණ පනත
- 1974 අංක 09 දරණ පනත
- 1993 අංක 24 දරණ පනත
- දේ.ණ.ස.ස. අරමුදලේ නියෝග
  - 1996 ජනවාරි 10 වැනි බදාදා දින අංක 905/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නියෝග පළ කර ඇත.
  - 1996 මැයි 10 වැනි සිකුරාදා දින අංක 922/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නියෝග පළ කර ඇත.
  - 2012 අගෝස්තු 16 වැනි බ්‍රහස්පතින්දා දින අංක 1771/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නියෝග පළ කර ඇත.
  - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී විසින් නිකුත් කර ඇති අභ්‍යන්තර කාර්යාල නියෝග

කළමනාකරණ සංයුතිය හා ක්‍රියාවලිය

සභාපති

කේ.ඩී.එන්.රන්ජිත් අසෝක මහතා

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන දෙපාර්තමේන්තුව



අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

කේ.ඩී.චිත්‍රපාල මහතා



නියෝජ්‍ය අධ්‍යක්ෂ

(මූල්‍ය සහ පරිපාලන)

කේ.ඒ.ඩී.ඩී.කහදවල මහත්මිය



නියෝජ්‍ය අධ්‍යක්ෂ

(මෙහෙයුම්)

ඒ.එම්.ඩී.ඩී.කේ.අබේසංහ මහත්මිය



සහකාර ගණකාධිකාරී

කේ.බී.විජයරත්න මහතා



පරිපාලන නිලධාරී

කේ.ජී.ඩී.ටී.නන්දසේන මහත්මිය



කොමසාරිස් මණ්ඩල ලේකම්

එම්.එල්.ශම්මිකා මහත්මිය



කළමනාකරණ ක්‍රියාවලිය

1993 අංක 24 දරණ දේශීය ණය සහ සංවර්ධන (සංශෝධිත) පනතේ 2 වගන්තිය ප්‍රකාර කොමසාරිස් මණ්ඩලය විෂය භාරගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන අවම වශයෙන් සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(අ) සභාපති - විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්. (නිල බලයෙන්)

(ආ) මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු.

(ඇ) එක් එක් පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් 09 දෙනෙකු.

(ඈ) විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් නම් කරනු ලබන තිදෙනෙකු.

ඒකාබද්ධ පාලන ක්‍රියාවලිය

ආයතනයේ පාලන ක්‍රියාවලිය කොමසාරිස් මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන සංයුක්ත ක්‍රියාවලියක් වශයෙන් හැඳින්විය හැකිය. පාලන ක්‍රමයක වැදගත්ම අංගය වන මෙය ආයතනයේ ඒකාබද්ධ සාර්ථකත්වය සහ අඛණ්ඩ ආර්ථිකමය පැවත්මට ඉවහල් වේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය,ඒකාබද්ධ පාලන ක්‍රියාවලිය පවත්වා ගැනීම මගින් ව්‍යාපාරික ආචාර ධර්ම, පාරදෘශ්‍යතාවය සහ ඉහළ වගකීම් තත්වයන් පවත්වාගැනීම සඳහා බැඳී ඇත.

කොමසාරිස් මණ්ඩලය

සංයුතිය

කොමසාරිස් මණ්ඩලය සභාපති ඇතුළු දාහතර දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ විශේෂිත දැනුම සහ පළපුරුද්ද ආයතනයේ ව්‍යාපාරික ක්‍රියාවලියට උපකාරී වේ. කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් කිසිවකු ආයතනය සමග ගනුදෙනු වලට සම්බන්ධ නොවන අතර, එය ඔවුන්ගේ කාර්යයන් ඉටුකිරීමේදී ස්වාධීනත්වය පවත්වාගෙන යාමට ඉවහල් වී ඇත.

තීරණ ගැනීම

කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් අවශ්‍යතාවය මත මසකට වරක් රැස්වන අතර එහිදී එදිනෙදා කටයුතු ද විමර්ෂනයට භාජනය කරන අතරම සුවිශේෂ වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ද ගනු ලැබේ. තවද කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් විසින් ආයතනික අරමුණු ලභා කර ගැනීමට අදාළ වන උපාය මාර්ගද තීරණය කරනු ලබයි.

වගකීම

1. ආයතනික ශක්තිය, කාර්යක්ෂමතාව සහ අවදානම සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර උපාය මාර්ග සැකසීම.
2. ඉහත උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.
3. පවතින ක්‍රමවේදයේ ක්‍රියාකාරිත්වයට අදාළව අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, ආචාරධර්ම, පවතින නීති සහ ව්‍යවස්ථාවලට අනුකූලතාවය දක්වන බවට වගබලාගැනීම.
4. ප්‍රාග්ධන වියදම් නිරීක්ෂණ සහ අභිමන්ත්‍රණය හා සමාලෝචනය.
5. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කාර්සාධනය අධීක්ෂණය.
6. තොරතුරු ක්‍රමවේදය සහ විගණන ක්‍රියාවළිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලාගැනීම.

ස්වාධීන විනිශ්චය

කොමසාරිස් මණ්ඩලයේ ක්‍රියාකාරකම් වලදී සෑම කොමසාරිස්වරයෙකුම තම ස්වාධීන මතය ප්‍රකාශ කළ යුතු අතර, අනෙක් පාර්ශව වල අයුතු බලපෑම් වලට හෝ අගති ගාමී බලපෑම් වලට යටත් නොවිය යුතුය. උපාය මාර්ග පිලිබඳ තීරණ ගැනීම, උපාය මාර්ග ක්‍රියාවට නැංවීම, කාර්සාධන සමාලෝචනය, සම්පත් බෙදාහැරීම සහ ව්‍යාපාරික ආචාරධර්ම පවත්වාගෙන යාම ආදී කටයුතු සඳහා කොමසාරිස්වරුන් අවධානය යොමුකළ යුතු වේ.

සභාපති

සභාපතිතුමාගේ කාර්භාරය පැහැදිළිව විස්තර කර වෙන්කර දක්වා ඇති අතර, එමගින් ආයතනය තුල බල තුලනයක් සහතික කිරීමට හැකිවීම නිසා පුද්ගලයන්ගේ තනි කැමැත්ත අනුව තීරණ ගැනීමේ ස්වභාවය සීමාවී ඇත.

සභාපතිතුමාගේ කාර්භාරය

කොමසාරිස් මණ්ඩලය වෙත නායකත්වය ලබාදීම සහ උපායමාර්ගික මගපෙන්වීමත් සියළුම ආකාරයේ රැස්වීම් වෘත්තීමය තත්වයෙන් සිදුකරන බවට වගබලා ගැනීමත් සභාපති විසින් කළ යුතුය.


කොමසාරිස් මණ්ඩලය පත්කිරීම

කොමසාරිස් මණ්ඩලය පත්කිරීමේ ක්‍රියා පටිපාටිය ඉතා පැහැදිලි විනිවිද භාවයෙන් යුක්ත වන අතර, එය අදාළ ආඥා පනත අනුව පැහැදිලි කර ඇත.

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම හා ප්‍රසිද්ධ කිරීම

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ කට්ටලය පහත සඳහන් ආයතනවලට ද පිටපත් සහිතව 2024.02.29 වන දින විගණන සඳහා විගණකාධිපති, රාජ්‍ය විගණන කාර්යාලය, පොල්දූව පාර, බත්තරමුල්ල. යන කාර්යාලයට භාර දෙන ලදි.

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ කට්ටලය සඳහා පත්‍රිකා අංක BP/OTH/12/2024 මඟින් 2024.02.27 දින පැවති කොමසාරිස් මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත.



රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமை
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Governme

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
உள்ளூராட்சி, அபிவிருத்திநிதியம்
Local Loans & Development Fund

24 ඒ, වෝඩ් පෙදෙස, කොළඹ 07
24ஏ, வோர்ட் பிளேஸ், கொழும்பு - 07
24A, Ward Place, Colombo 07, Sri Lanka.

Telephone 011-2685752/3
Fax 011-2691261
Your No.
My No LLDF/FS/2023

28.02.2024

Auditor General
National Audit Office
Polduwa Road
Battaramulla

29 FEB 2024

Dear Sir,

FINANCIAL STATEMENTS FOR THE YEAR ENDED 31st DECEMBER 2023

We forward herewith Financial Statements for the year ended 31st December 2023 of Local Loans and Development Fund for the Audit purpose.

This set of Financial Statements has been prepared after consideration of the audit observations and impairment adjustments given by you in previous audit.

The set of financial statements were approved by the meeting of the Board of Commissioners of Local Loans and Development Fund held on 27th February 2024. The signed meeting minutes of the Board of Commissioners will be forwarded you at our earliest.

Thank You,

Yours faithfully,

K.D.Chithrapala
Director/ Chief Executive Officer
Local Loans & Development Fund.

K.D. Chithrapala
Director / Chief Executive Officer
Local Loans and Development Fund

c.c.- 1. Director General, Department of Public Enterprises, Ministry of Finance
2. Director General, Department of Public Finance, Ministry of Finance
3. Director General, Corporate Affairs Division, Ministry of Finance
4. Superintend of Audit, Government Audit Branch, State Ministry of, Provincial Councils and Local Government

මානව සම්පත් පැතිකඩ

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මානව සම්පත ප්‍රධන වශයෙන් කොටස් 02කි.

- කොමසාරිස් මණ්ඩලය
- අනුමත සේවක මණ්ඩලය

2023.12.31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය

සභාපති

01.කේ.ඩී.එන්.රන්ජිත් අසෝක මහතා

ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය



භාණ්ඩාගාර නියෝජනය

02. ඩබ්.ජී.කේ.එල්.චන්ද්‍රසේකර මහත්මිය

නියෝජ්‍ය අධ්‍යක්ෂ
විදේශ සම්පත්දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය



සාමාජිකයින්





03. ජී.එච්.එම්.ඒ.ප්‍රේමසිංහ මහතා
ප්‍රධාන ලේකම් (මධ්‍යම පළාත)

04. සී.ජේ.එම්.ජී.සී.චන්ද්‍රසිරිබණ්ඩාර මහතා
ප්‍රධාන ලේකම් (උතුරු මැද පළාත)





05. දමයන්ති පරණගම මහත්මිය
ප්‍රධාන ලේකම් (ඌව පළාත)

06. මහින්ද එස් වීරසූරිය මහතා
ප්‍රධාන ලේකම් (සබරගමුව පළාත)





07. ආර්.එම්.පී.එස්.රත්නායක මහතා
ප්‍රධාන ලේකම් (නැගෙනහිරපළාත)

08. කේ.එම්.එච්.එස්.කේ.ජයලත් මහතා
පළාත් පාලන කොමසාරිස්(වයඹ පළාත)



09. ඩබ්ලිව්.වී.ප්‍රදීප් යසරත්න මහතා
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)



10. එස්.කුගදාස් මහතා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (උතුරු පළාත)



11. රනිල් වික්‍රමසේකර මහතා
පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත)



12. කේ.පී.එල්.ඒ.කාරියවසම් මහතා
ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද
සාමාජික
සිතාවක ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති



13. තෙන්නකෝන් රුසිරුපාල මහතා
ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද
සාමාජික
ලංකා බැංකුවේ හිටපු සභාපති



14. ඒ.බී.හේරත් මහතා
ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද
සාමාජික
ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හිටපු
නිලධාරී

2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය මණ්ඩලය

තනතුර	2023.12.31 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව	අනුමත සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යක්ෂ	1	1	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය සහ පරිපාලන)	1	1	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්)	1	1	-
සහකාර ගණකාධිකාරී	1	1	-
අභ්‍යන්තර විගණන නිලධාරී	-	1	1
පරිපාලන නිලධාරී	1	1	-
සංවර්ධන නිලධාරී	17	25	8
කළමනාකරණ සහකාර	7	11	4
රියදුරු	2	2	-
කාර්යාල කාර්ය සහායක	2	2	-
එකතුව	**33**	**46**	**13**

කුසලතා වර්ධනය (පුහුණුවීම) – SKILLS DEVELOPMENT

දේශීය ණය සහ සංවර්ධන අරමුදලට අදාල කාර්යයන් ඉටු කිරීමේ දී මානව සම්පතෙහි කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වීම් ඉතා පිටුවහලක් වේ. එබැවින් ලංකාවේ උසස් පුහුණු ආයතනයක් වන නිපුණතා සංවර්ධන අරමුදලේ (SDFL) පුහුණු වැඩසටහන් සඳහා මෙම ආයතනයේ මානව සම්පත සම්බන්ධ කරනු ලැබේ.

2023 වර්ෂයේ නිලධාරීන් විසින් සහභාගි වූ පුහුණු වැඩසටහන්

- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය
- අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලන ක්‍රම

පාලන වාර්තා

කොමසාරිස් මණ්ඩල රැස්වීම්

1993 අංක 24 දරන සංශෝධිත දේශීය ණය සහ සංවර්ධන අරමුදල් පනතේ දෙවෙනි වගන්තියේ දෙවැනි උප වගන්තියට අනුව කොමසාරිස් මණ්ඩල රැස්වීම් අවම වශයෙන් මාස තුනකට එක් රැස්වීමක්වත් පැවැත් විය යුතුය.

සංයුතිය

- කොමසාරිස් මණ්ඩලය
- කාර්ය මණ්ඩලයේ නිලධාරීන්

කොමසාරිස් මණ්ඩල රැස්වීමකදී අනිවාර්යෙන් සලකා බැලිය යුතු කරුණු

- පසුගිය වාර්තාව සභා සම්මත කර ගැනීම
- පසුගිය රැස්වීම් වාර්තාවෙන් පැන නැගුණු කරුණු සාකච්ඡා කිරීම
- පසුගිය රැස්වීම් වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය
- මාසික ගිණුම් ප්‍රකාශ හා මූල්‍ය තත්ව ප්‍රකාශය
- ණය අයදුම්පත් සලකා බැලීම
- පරිපාලන කරුණු සාකච්ඡා කිරීම
- වෙනත් කරුණු සාකච්ඡා කිරීම
- ඊලඟ කොමසාරිස් මණ්ඩල රැස්වීම පැවැත්විය යුතු දිනය තීරණය කිරීම

2023 වර්ෂයේ කොමසාරිස් මණ්ඩල රැස්වීම් පැවැත් වූ දිනයන්

i. 2023 පෙබරවාරි මස 24 වන දින ප.ව.3.00
ii. 2023 මැයි මස 26 වන දින ප.ව.4.00
iii. 2023 ජූනි මස 16 වන දින ප.ව.3.00 (විශේෂ රැස්වීමකි)
iv. 2023 අගෝස්තු මස 31 වන දින ප.ව.4.30
v. 2023 සැප්තැම්බර් මස 19 වන දින ප.ව.6.00
vi. 2023 ඔක්තොම්බර් මස 27 වන දින ප.ව.4.00
vii. 2023 නොවැම්බර් මස 30 වන දින ප.ව.4.30
viii. 2023 දෙසැම්බර් මස 28 වන දින ප.ව.3.00

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2023 වර්ෂය

2018 අංක 19 දරණ ජාතික විගනන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුපිහිටුවිය යුතු අතර, විගණන හා කළමනාකරණ කමිටුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීමට බැඳේ. 2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පී.ඊ.ඩී./55 ප්‍රකාර දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත්කර ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරයන් දෙදෙනෙක් සහ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකද ඇතුලත් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. කොමසාරිස් මණ්ඩලය නියෝජනය කරන භාණ්ඩාගාර නියෝජිත, එහි සභාපති ලෙස ද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත නිරීක්ෂක වශයෙන් ද සහභාගී වේ. අදාල වර්ෂය තුලදී කමිටුව 04 වරක් රැස්වූ අතර සෑම කාර්තුවකටම වරක් රැස්වේ.

(01) 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන

2022 වර්ෂයේ අවසාන ගිණුම් සමාලෝචනය සහ නිරීක්ෂණය සඳහා ඉදිරිපත් කර ඇත.

(02) 2022 වර්ෂයේ සවිස්තරාත්මක විගණකාධිපති වාර්තාව සමාලෝචනය

2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිළිබඳව සභාපති වෙත ඉදිරිපත් කරන සවිස්තරාත්මකවිගණකාධිපති වාර්තාව සමාලෝචනය කරනු ලැබූ අතර, එමගින් පැන නැගී ඇති කරුණු නිවැරදි කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා ආයතනය යොමු කරනු ලැබීය.

(අ) නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවන පරිදි වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී වෙත වැටුප් හා ප්‍රවාහන දීමනා ගෙවීම

මෙම ආයතනයේ හිටපු වැඩ බලන අධ්‍යක්ෂ වරයෙකු වූ ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු වන එස්.ඒ.එන්.ආර්.සුභසිංහ මහතා විසින් නීතිරීති හා රෙගුලාසිවලට පටහැනිව 2016 – 2015 වර්ෂ වලදී ලබා ගෙන ඇති වැටුප් සහ ප්‍රවාහන දීමනාව සම්බන්ධයෙන් වූ විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කිරීමට උපදෙස් ලබා දීම.

(ආ) මූල්‍ය / පරිපාලන සහ මානව සම්පත් ක්‍රියාපටිපාටි සංග්‍රහය පිළියෙල කිරීම.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල විසින් පිළියෙල කර ඇති මූල්‍ය සහ මානව සම්පත් ක්‍රියාපටිපාටි සංග්‍රහයෙහි ගුණාත්මක බව පරීක්ෂා කර කොමසාරිස් මණ්ඩලයට නිර්දේශයක් ලබා දීමට ගෙන ඇති තීරණය ප්‍රකාරව විගණන සහ කළමනාකරණ කමිටුව විසින් පහත නිර්දේශ ලබා දීම.

i) මූල්‍ය සහ මානව සම්පත් ක්‍රියාපටිපාටි සංග්‍රහය පිළියෙල කිරීමේ මූලික අරමුණ අදාළ කාර්ය මණ්ඩලයට මූල්‍ය සහ මානව සම්පත් සම්පත් කළමනාකරණය සඳහා ඔවුන්ගේ වගකීම්, මූල්‍ය පද්ධතිය සහ ක්‍රියාපටිපාටි අවබෝධ කර ගැනීමට උපකාර කිරීම වන අතර නමුත් මෙම ක්‍රියාපටිපාටි සංග්‍රහය පිළියෙල කිරීමේදී මෙම මූලික අරමුණ ඉටු වී නොමැති අතර ක්‍රියාපටිපාටි සංග්‍රහයක අනිවාර්යයෙන්ම පැවතිය යුතු ඒ ඒ කාර්යය / ක්‍රියාවලිය සම්බන්ධයෙන් අදාළ වන නිලධාරියා සහ වගකීම පැහැදිලිව දක්වා නොමැති බව නිරීක්ෂණය කරන අතර මෙම ක්‍රියාපටිපාටි සංග්‍රහය කොමසාරිස් මණ්ඩලයට නිර්දේශ කිරීමේ තත්වයට පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය කිරීම.

ii) මෙම ක්‍රියාපටිපාටි සංග්‍රහය භාවිතා කරන්නාට පහසුවෙන් අවබෝධ කර ගත හැකි ආකාරයට ඉදිරිපත් කළ යුතු අතර කළ යුතු සහ නොකළ යුතු දෑ පැහැදිලිව දක්වා තිබිය යුතුය. එහෙත් මෙම ක්‍රියාපටිපාටි සංග්‍රහයෙහි දක්වා ඇති ආකාරය පැටලිලි සහගත මෙන්ම වැරදි සහගත බවට නිරීක්ෂණය කිරීම.

iii) ඒ අනුව මෙම ක්‍රියාපටිපාටි සංග්‍රහය නැවත පිළියෙල කර කොමසාරිස් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට යෝජනා වීම.

(ඇ) **SLFRS 9 අනුව ණය හානිකරණ අගය ගැළපීම.**

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ණය හානිකරණ ගැළපුම සම්බන්ධයෙන් අනුගමනය කර ඇති මොඩලය ලාභය පෙරදැරි කර නොගත් දේශීය ණය සහ සංවර්ධන අරමුදල වැනි ආයතන වලට ගැළපිය නොහැකි බව විගණකාධිපති විසින් පෙන්වා දී තිබූ අතර එම හේතුව නිසාම දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගැලපෙන ආකෘතියක් නිර්මාණය කිරීම සඳහා ප්‍රමුඛ වරලත් ගණකාධිකාරී ආයතනයකට භාර දී තිබූ අදාළ මොඩලය සකස් කිරීමේ කාර්යයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.

(ඇ) **දේශීය ණය සහ සංවර්ධන අරමුදල විසින් පවත්වා ගෙන යන පරිසනක මෘදුකාංග පද්ධතිය**

දැනට ewis ආයතනය විසින් ස්ථාපිත කර ඇති ණය තොරතුරු සහ මූල්‍ය කළමනාකරණ පද්ධතියේ දත්ත වල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් 2022 විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබුණි. මේ හේතුවෙන් මෙම ආයතනයට අළුතින් පරිසනක පද්ධතියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් අතර කඩිනමින් මෙම පරිසනක පද්ධතිය සකස් කිරීමට අවශ්‍ය මඟපෙන්වීම සහ උපදෙස් ලබා දීම.

(03) 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව

2022 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය මගපෙන්වීම සහ උපදෙස් ලබාදීම.

(04) ව්‍යවස්ථා, කොන්දේසි, නීතිරීති හා චක්‍ර ලේඛන සමග අනුකූලතාවය

ඒකාබද්ධ සැලසුම පිළියෙල කිරීම සඳහා උපදෙස් ලබාදුන් අතර 2024 වර්ෂයේ මූල්‍යමය බලතල මු.රෙ.135 යටතේ පැවරීම සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බවට උපදෙස් දෙන ලදී.

(05) පද්ධති සහ පාලන ක්‍රම ඵලදායීතාවය

අයවැය ලේඛන, පාලන පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට පාලන අධිකාරියට උපදෙස් ලබාදෙන ලදී. එමෙන්ම ණය අයකර ගැනීමේ ක්‍රියාවළිය නිරීක්ෂණය කර අදාළ පියවර ගැනීමට ප්‍රධාන විධායක නිලධාරීට උපදෙස් දෙන ලදී.

(06) බඳවාගැනීමේ සහ උසස්වීම් පටිපාටිය සංශෝධනය කිරීම

මෙම ආයතනයේ බඳවාගැනීම් සහ උසස්කිරීම් පටිපාටිය සංශෝධනය කර අදාළ අනුමැතීන් කඩිනමින් ලබාගැනීමට අවශ්‍ය මගපෙන්වීම සහ උපදෙස් ලබාදීම.

(07) හිඟ ණය අයකිරීම

අක්‍රීය තත්වයේ පවතින ණය මුදල් අයකිරීම සඳහා පළාත් පාලන ආයතන සමග සාකච්ඡාකර එම ආයතන වලට ගෙවීමට හැකි වාරික මුදලකට ණය මුදල ප්‍රතිව්‍යූහගතකර අයකිරීමටත්, පළාත් මට්ටමින් යොමුකර ඒ සඳහා ප්‍රමුඛත්වය ලබාදී සාකච්ඡා කිරීමත් නැතහොත් නීතිමය පියවර ගැනීම සඳහා කොමසාරිස් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නිර්දේශ කර ඇත.

(08) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් - 2023

විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව සාකච්ඡාකර අදාළ නිවැරදි කිරීම් සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

(09) තිරසාර සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන පනත මගින් ප්‍රධාන අරමුණු 17 ක් හඳුනාගෙන ඇති බවත්, ඒවායින් ආයතනයට වඩා වාසිදායක අරමුණු හඳුනාගෙන එම අරමුණු වලට ලඟාවීම සඳහා ආයතනයේ මුළු සේවක සංඛ්‍යාව සඳහා ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPI) සකස් කර, අදාළ ඇගයීමේ ක්‍රමවේදය සකස් විය යුතු බව පෙන්වා දීම.

2023 වර්ෂයේ විගණන හා කළමනිකරණ කමිටු සාමාජිකයින්

ඩබ්.ජී.කේ.එල්.චන්ද්‍රසේකර මහත්මිය	භාණ්ඩාගාර නියෝජනය	සභාපති
ප්‍රදීප් යසරත්න මහතා	ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත	සාමාජික
ඒ.බී.හේරත් මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද කොමසාරිස් මණ්ඩල සාමාජික	සාමාජික
එම්.ඩී.ඊ.එස්.වාස් මහත්මිය	ජාතික විගණන කාර්යාලය	නිරීක්ෂක
හිරෝශිමා නවරත්න මහත්මිය	ප්‍රධාන අභ්‍යන්තර විගණක රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (පළාත් සභා හා පළාත් පාලන අංශය)	කැඳවුම්කරු

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය කමිටුව

ණය කමිටුව සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඉන් පළාත් නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු සහ රේඛීය අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යවරයා විසින් නම් කරන ලද ස්වාධීන විධායක නොවන සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

කොමසාරිස් මණ්ඩලය විසින් ස්ථිර සභාපතිවරයෙකු පත් නොකරන්නේ නම්, වත්මන් කමිටුවේ සාමාජිකයින් අතර ණය කමිටුවේ සභාපතිවරයා පත් කළ හැකිය. ණය කමිටුවේ රැස්වීම් සඳහා ගණපූරණය එහි සිටින සාමාජිකයින් තිදෙනෙකු විය යුතු අතර, අවම වශයෙන් එක් අයෙකු විධායක නොවන සාමාජිකයෙකු විය යුතුය.

කොමසාරිස් මණ්ඩලයේ යෝජනාවක් මගින් ණය කමිටුව ස්ථාපිත කර ඇති අතර, දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය කාර්යයන්හි ඇතැම් අංශ අධීක්ෂණය කිරීමේ වගකීම කොමසාරිස් මණ්ඩලය විසින් පවරා ඇත.

ණය කමිටුවේ සාමාජිකයන් නොවන දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂවරයාට අවශ්‍ය විටෙක කමිටුවේ රැස්වීම්වලට සහභාගි විය හැක. ණය කමිටුව නියමිත මණ්ඩල රැස්වීමට පෙර, අවම වශයෙන් වසරකට 12 වතාවක් රැස්විය යුතුය.

අරමුණු සහ වගකීම්

- ණය ලබාදීමේ මාර්ගෝපදේශවලට සහ ප්‍රධාන ණය ප්‍රතිපත්තිවලට අවශ්‍ය සංශෝධන සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කිරීම.
- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පිළිබඳ පුළුල් ආවරණයක් ලබා දීම සඳහා ණය ලබා දීමේ පහසුකම් පුළුල් කිරීම.
- ණය ක්‍රියා පටිපාටි සඳහා පහසුකම් සැලසීම සහ එමගින් ණය ලබාදීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.
- ණය වල ගුණාත්මකභාවය, අවදානම් කළමනාකරණය සහ ප්‍රතිපත්ති ක්‍රියා පටිපාටිය පිළිපැදීම පිළිබඳ වාර්තා ලබා ගැනීම සහ සමාලෝචනය කිරීම.

ණය කමිටුවේ කාර්යයන්

- කොමසාරිස් මණ්ඩලය විසින් වරින් වර ණය කමිටුවට පැනවිය හැකි එවැනි සීමා කිරීම්වලට යටත්ව, ණය අවදානම පවත්වාගෙන යෑම.
- එක් එක් ව්‍යාපෘතිවලට අදාලව ණය අයදුම්පත් සලකා බලා අනුමත කිරීම.
- එය ණය අයදුම්පත්‍රයට අදාළ සියලුම අදාළ ලියකියවිලි ලබාගෙන ඇති බව සහතික කිරීම.
- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කර නිර්දේශ කිරීම.
- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, අදාළ ප්‍රමිතීන්, ක්‍රියා පටිපාටි සහ ණය තීරණ සම්බන්ධයෙන් පාලන පරිසරයේ යෙදීමේ සඵලතාවය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.

- ණය හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා කොමසාරිස් මණ්ඩලය විසින් පිහිටුවා ඇති පද්ධති සැලසුම් කර ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම.
- ණය අයදුම්පත් සහ සියලුම උපකාරක ලියකියවිලි සමාලෝචනය කිරීම සහ ඇගයීම සහ ණය කමිටුවේ නිර්දේශ ලබාදීම.
- ණය පැහැර හැරීන ගනුදෙනුකරුවන් සම්බන්ධව විමර්ශනය කිරීමට.
- ණය අයකර ගැනීමේ ක්‍රියාවලීන් සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදල සහය වීම.

ණය කමිටුවේ වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටිය

ණය කමිටුවේ ලේකම් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වනු ඇත.

කමිටුවේ ලේකම් විසින් පහත වාර්තා පවත්වාගෙන යනු ඇත.

- රැස්වීම් කැඳවීම සඳහා දැනුම්දීම්.
- සාමාජිකයින්ගේ පැමිණීම සටහන් කර ගැනීම.
- ණය කමිටුවේ සියලුම රැස්වීම්වල තහවුරු කළ කමිටු පත්‍රිකා.
- ණය කමිටුව විසින් කොමසාරිස් මණ්ඩලය වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලද සියලුම පිටපත්.
- ණය කමිටුවේ වත්මන් සාමාජිකයින්ගේ තොරතුරු සහිත වාර්තාවන් සහ ණය කමිටුවේ වෙනස්කම් සිදු වී ඇත් නම් ඒ පිළිබඳ වාර්තාවන්.
- ණය කමිටුවේ අනුමැතිය සහ නිර්දේශ සඳහා ඉදිරිපත් කරන ලද සියලුම ණය කමිටු පත්‍රිකා.

ණය කමිටුවේ සංයුතිය

සභාපති **තෙන්නකෝන් රුසිරුපාල මහතා** (ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද)

සාමාජිකයින්

- **ඩබ්.ජී.කේ.එල්.චන්ද්‍රසේකර මහත්මිය** (නියෝජ්‍ය අධ්‍යක්ෂ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය)
- **කේ.එම්.එච්.එස්.කේ.ජයලත් මහතා** (පළාත් පාලන කොමසාරිස් - වයඹ පළාත)
- **ඩබ්ලිව්.වී.ප්‍රදීප් යසරත්න මහතා** (ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත)
- **මහින්ද එස් වීරසූරිය මහතා** (ප්‍රධාන ලේකම් - සබරගමුව පළාත)

මුදල් හා මූල්‍ය පාලන උපක්‍රම

- වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සකස් කර සම්මත කර ගැනීම.
- මාසිකව බැංකු සැසඳුම් පිළියෙල කිරීම.
- වැය ලේඛන නඩත්තු කිරීම (වියදම් වාර්තා).
- මාසික වාර්තා සකස් කිරීම.

මූල්‍ය ප්‍රකාශවල අරමුණු

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශනවල අරමුණ වන්නේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල නම් වූ වාර්තාකරණ ලබන ආයතනය පිළිබඳව 2023.13.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තොරතුරු, මූල්‍ය ප්‍රකාශන පරීශීලනය කරන්නන්ට ප්‍රයෝජනවත් වන ආකාරයට ලබා දීමයි.

මූල්‍ය ප්‍රකාශන කට්ටලය හැඳින්වීම

2023.01.01 න් ආරම්භ වී 2023.12.31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන කට්ටලය පහත දැක්වෙන දෑ ඇතුලත් වේ.

01. විස්තීරණ ආදායම් ප්‍රකාශනයක්
02. මූල්‍යතත්ව ප්‍රකාශනයක්
03. හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයක්
04. මුදල් ප්‍රවාහයේ ප්‍රකාශනයක්
05. සැලකිය යුතු අන්දමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් සවිස්තරාත්මක තොරතුරුවල සාරාංශ ගත සටහන්

විගණන වාර්තාව



CFO/LG

02

1977

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/D/LLDF/01/23/02

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 ජූනි 13 දින

ලැබුණා 19 JUN 2024

සභාපති,
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 04 JUL 2024

ලැබුණා 19 JUN 2024 LG 11176

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත:- 01. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
02. ලේකම්-රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } PAF/D/LLDF/01/23/02 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 ජූනි 13 දින

සභාපති,
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම් කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය ව්‍යාචනය සඳහා පදනම්

(අ) 2021 හා 2022 වර්ෂවල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 අනුව හානිකරණ වටිනාකම් ගණනය කිරීම සඳහා සලකා බැලූ ණය ශේෂ සහ 2021 සහ 2022 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ණය ශේෂ අතර පිළිවෙලින් රු.196,097,689 ක් හා රු.227,896,243 ක් ලෙස වෙනස්කම් පැවතීම හේතුවෙන්, 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් ගණනය කරන ලද හානිකරණ ගැලපීම් වූ පිළිවෙලින් රු.230,284,678ක ලාභයක් හා රු.761,798,206ක අලාභයක් ඇතුළත් කර නැවත ගළපා සකස් කරන ලද ගිණුම්වල නිවැරදිකාවය විගණනයේදී තහවුරු නොවිය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ණය හානිකරණය ගැලපීමේදී ණය හා ලැබිය යුතු වටිනාකම්, කාල විශ්ලේෂණ වාර්තාවෙහි ශේෂයන්ට වඩා රු.770,172,169ක් වැඩියෙන් යොදාගැනීමෙන් රු.167,561,679ක් වූ හානිකරණ අගයෙහි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු නොවිය. තවද, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07 අනුව හානිකරණ අලාභයක් සිදුවී ඇති බව නිශ්චය කිරීමට යොදාගත් නිර්ණායක මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළයුතු වුවද එසේ කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 ට අනුව රු.76,852,323 ක් වූ ලැබිය යුතු පොලී වටිනාකම් ක්‍රමක්ෂය පිරිවැයට එකතු කොට දක්වනවා වෙනුවට වෙනත් වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඈ) ආයතනයේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කිරීමේ අරමුණින් සංවර්ධනය කරන ලද මොබයිල් ඇප් මෘදුකාංගයේ වටිනාකම් රු.2,437,425ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අස්පෘශ්‍ය වත්කම් ලෙස ඉදිරිපත් නොකර පරිගණක දෘඩාංග යටතේ දක්වා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාරව ප්‍රධාන කළමනාකරණ පිරිසෙහි පාරිශ්‍රමිකය මූල්‍ය ප්‍රකාශන තුළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු යටතේ හෙළිදරව් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ හිටපු වැඩ බලන අධ්‍යක්ෂක හා වර්තමාන අධ්‍යක්ෂවරයා වෙත ගෙවන ලද රු.1,179,488 ක් වූ ප්‍රතිලාභ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) ණය වර්ග 04කට අදාළව ණය හා ලැබිය යුතු ශේෂයන්ගේ ඇතුළත් ප්‍රාග්ධන හා අවිනිශ්චිත පොලී එකතුව රු.1,472,085,856 ක් වුවත් උපලේඛනවල එය රු.1,444,252,401ක් වූයෙන් ඒ අතර රු.27,833,455 ක වෙනසක් විය.

(උ) සමාලෝචිත වර්ෂයේදී අවිනිශ්චිත පොලී ගිණුම් 04ක රු.59,718,232ක් අඩුකර දැක්වීම හා අවිනිශ්චිත පොලී ගිණුම් 02ක රු.1,607,963ක් වැඩියෙන් දැක්වීම සහ ශුද්ධ ප්‍රතිඵලය සමුච්චිත අරමුදලට ගැළපීම් කර තිබූ නමුත් එම ගැළපීමට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඌ) ඉකුත් වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම වැඩියෙන් ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලිය රු.14,015,293 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(එ) විගණනයේ ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම රු.51,270,726 ක් වුවද එය රු.36,688,054 ක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දැක්වීම හේතුවෙන් ආදායම් බදු වියදම රු.14,582,672 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජන ආදායම මත ගෙවන ලද අත්තිකාරම් ආදායම් බද්ද රු.7,021,065 ක් වුවද ඉන් රු.2,190,461ක් ඉකුත් වර්ෂයට අදාළ ආදායම් බදු ගෙවීමේදී අඩුකර රු.4,830,604ක් වෙනත් වත්කම් යටතේ දක්වා තිබුණි. ඒ හේතුවෙන් රු.4,830,604කින් ගෙවිය යුතු ආදයම් බදු මුදල් හා වෙනත් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) විගණනයේදී ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විලම්භිත බදු වගකීම් රු.326,265ක් වුවද එය රු.7,881,953 ක විලම්භිත බදු වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම හේතුවෙන්, විලම්භිත බදු වියදම ලෙස රු.7,530,191ක් ගිණුම් ගත විය යුතු වුවද රු.25,496 ක විලම්භිත බදු ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) වර්ෂය තුළ මිලදී ගත් රු.7,736,650ක පරිගණක උපාංග සහ උපකරණවලට අදාළ ක්ෂය රු.1,407,877ක් වුවත් එය රු. 5,412,576 ලෙස රු.4,004,699ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ක) විගණනයේදී ගණනය කිරීම් අනුව එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ ප්‍රදානවලින් ලබාගත් වත්කම් සඳහා ප්‍රදාන ක්‍රමක්ෂය ආදායම රු.2,397,639 වුවත් එය රු.6,397,057ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් රු.3,999,418 කින් වෙනත් මෙහෙයුම් ආදායම් වැඩියෙන් දක්වා තිබුණි.

(ග) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම රු.226,560,800ක් අඩුවෙන් ද, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම රු.130,126,748ක් වැඩියෙන් ද, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම රු.96,425,733ක් අඩුවෙන් ද ගළපා තිබුණි.

(ජ) අරමුදලේ ණයගැති ශේෂයන් අදාල ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සමඟ සැසඳීමේදී රු.192,550,383 ක වෙනසක් නිරීක්ෂණය විය.

ඉහත විස්තර කර ඇති පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගණුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැළපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 අරමුදලේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු අරමුදලේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවා ද යන්න සලකා බැලීමයි.

අරමුදලේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මා ගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලැබී නොමැති අතර, නිසි ගිණුම් වාර්තා අරමුදල තබා තිබෙද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම් කොටසේ දක්වා ඇති (අ), (ඇ), (ඊ) , (ඌ), (ඔ)සහ (ඡ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

2017 සිට 2023 දක්වා පැවතෙන රු.3,495,531 ක අත්තිකාරම් ගිණුම්වල ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටුව 6 | 6

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතවලට අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සකස් කර ඇත.

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්ත ඌනතාවයක් හා වෙනත් විස්තීරණ ආදායම් පිළිබඳ තොරතුරු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර ඇත. 2021 හා 2022 කාල පරිච්ඡේදයට සම්බන්ධ සත්‍ය තොරතුරු එනම් තුළනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත.

දේශීය ණය සහ සංවර්ධනඅරමුදල				
විස්තීරණ ආදායම් ප්‍රකාශනය				
2023 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා				
		2023	2022	2021
			ප්‍රතිප්‍රකාශිත	ප්‍රතිප්‍රකාශිත
	සටහන්	රු	රු	රු
පොලී ආදායම	4	307,142,464	289,204,262	275,545,152
පොලී වියදම	5	109,444,196	113,769,524	126,304,798
ශුද්ධ පොලී ආදායම		**197,698,267**	**175,434,738**	**149,240,354**
වෙනත් මෙහෙයුම් ආදායම්	6	139,346,837	165,600,174	63,434,258
මුළු මෙහෙයුම් ආදායම		**337,045,105**	**341,034,912**	**212,674,612**
අපහායන ගාස්තු	13	(167,561,679)	(761,798,206)	230,284,678
ශුද්ධ මෙහෙයුම් ආදායම		**169,483,426**	**(420,763,294)**	**442,959,290**
පුද්ගලික වියදම්	7	29,386,782	29,388,809	26,846,049
ක්ෂය දේ.පි.උ	14	7,153,640	1,120,942	1,758,084
ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම්	8	-	29,997,185	74,910,206
වෙනත් මෙහෙයුම් වියදම්	9	36,512,166	13,995,967	11,900,825
බදු වලට පෙර මෙහෙයුම් ලාභය		**96,430,838**	**(495,266,197)**	**327,544,126**
බදු වියදම්	10	36,688,054	36,418,499	16,237,444
වර්ෂය සඳහා ලාභය		**59,742,784**	**(531,684,696)**	**311,306,682**
<u>වෙනත් විස්තීර්ණ ආදායම්</u>				
සැලසුම්ගත ප්‍රතිලාභ සැලසුම මත සත්‍ය හානිය		2,188,332	(1,023,134)	(156,388)
විලම්බිත බදු	10	(25,496)	(1,712,928)	3,400,207
මුළු විස්තීර්ණ ආදායම		**57,579,949**	**(528,948,635)**	**314,550,501**

මූල්‍ය තත්ව ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතවලට අනුව මූල්‍ය තත්ව ප්‍රකාශය සකස් කර ඇත. 2023.12.31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වත්කම්, වගකීම් සහ හිමිකම සඳහා වූ මූල්‍ය තත්ව ප්‍රකාශය වත්කම්, වගකීම් හා හිමිකම් ලෙස ප්‍රභේදවලට බෙදා සකස් කර ඉදිරිපත් කර ඇත. එමෙන්ම 2021 හා 2022 කාල පරිච්ඡේදයට සම්බන්ධ සත්‍ය තොරතුරු තුළනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත.


දේශීය ණය සහ සංවර්ධනඅරමුදල				
මූල්‍ය තත්ව ප්‍රකාශය				
2023 දෙසැම්බර්31 දිනට				
		2023	2023 ජනවාරි1	2022 ජනවාරි1
			ප්‍රති ප්‍රකාශනය	ප්‍රති ප්‍රකාශනය
	සටහන්	රු	රු	රු
වත්කම්				
මුදල් සහ මුදල් සමාන දෑ	11	96,667,455	121,162,801	86,751,731
බැංකු ශේෂය	12	685,058,333	598,000,000	948,000,000
ණය සහ ලැබිය යුතු දෑ	13	2,865,193,520	3,150,830,065	3,684,854,519
දේපල පිරියත සහ උපකරණ	14	7,088,731	1,830,898	2,908,640
විලම්බිත බදු වත්කම්	17.1	7,881,953	7,856,456	6,143,529
වෙනත් වත්කම්	15	103,535,383	99,691,917	109,801,288
මුළු වත්කම්		**3,765,425,374**	**3,979,372,136**	**4,838,459,706**
හිමිකම් සහ වගකීම්				
වගකීම්				
පොලීසහිත ණය ගැනීම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ	16	4,015,006,605	4,263,982,469	4,590,440,319
වර්තමාන බදු වගකීම	17	36,688,054	36,418,499	16,237,444
විලම්බිත බදු වගකීම	17.1	-	-	-
පශ්චාත් සේවානියුක්ති ප්‍රතිලාභ වගකීම	18	8,249,612	4,853,000	5,912,476
වෙනත් වගකීම්	19	48,345,271	7,811,220	32,900,492
මුළු වගකීම්		**4,108,289,542**	**4,313,065,189**	**4,645,490,731**
හිමිකම්				
රඳවාගත් ඉපයුම්		-342,864,168	-333,693,053	192,968,975
මුළු වගකීම් හිමිකම්		**3,765,425,374**	**3,979,372,136**	**4,838,459,706**

මෙකී මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති වලටඅනුකූලව පිලියෙල කර ඇති අතර එමගින් 2023දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධනඅරමුදලේ සැබෑ කටයුතු පිලිබඳ සාධාරණ සහ සත්‍ය තත්වය සහ එහි අවසන් වූ කාලපරිච්ඡේදයෙහි අතිරික්තය පිලිබිඹු කරන බවට සහතික කෙරේ.



කේ.ඩී.චිත්‍රපාල

ප්‍රධාන විධායක නිලධාරී



කේ.ඒ.ඩී.ඩී.කහඳවල


නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය සහ පරිපාලන)

මෙකී මූල්‍ය ප්‍රකාශයන් පිලියෙල කර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩලය වගකීමට බැඳේ. කොමසාරිස් මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළා;



ප්‍රදීප් යසරත්න

සභාපති



කේ.පී.එල්.ඒ.කාරියවසම්

කොමසාරිස් මණ්ඩල සාමාජික

2024 පෙබරවාරි 27

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතවලට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන මුදල් ප්‍රවාහ මෙහෙයුම් ක්‍රියාකාරකම්, ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් අනුව වර්ගීකරණයක් මඟින් දේශීය ණය සහ සංවර්ධන අරමුදල මුදල් ප්‍රවාහය ඉදිරිපත් කර ඇත.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල			
මුදල් ප්‍රවාහ ප්‍රකාශය			
2023 දෙසැම්බර් 31 දිනට			
		2023	2022
			ප්‍රතිප්‍රකාශිත
	සටහන්	රු	රු
මෙහෙයුම් ක්‍රියාකාරිත්වය මගින් වන මුදල් ප්‍රවාහය			
බදු වලට පෙර ලාභය		**96,430,838**	**(495,266,197)**
ගැලපුම් කිරීම්			
ක්ෂය සහ ක්‍රමක්ෂය		7,153,640	31,118,127
අපහායන ගාස්තු		167,561,679	761,798,206
ප්‍රදාන ක්‍රමක්ෂය ආදායම්		(7,346,384)	(443,541)
වෙනත් ආදායම්		-	-
පාරිතෝෂික සහ උපචිත වියදම්		1,330,950	1,217,798
පොලී වියදම්		109,444,196	113,769,524
ආයෝජන ආදායම්		(122,293,513)	(151,743,746)
කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය		**252,281,407**	**260,450,170**
වෙනත් වත්කම් (වැඩිවීම්)/අඩුවීම්		(23,703,324)	(34,169,649)
වෙනත් වගකීම් (වැඩිවීම්)/අඩුවීම්		1,854,462	13,384,834
මෙහෙයුම් මගින් උපදවන ලද මුදල්		**230,432,545**	**239,665,355**
ඉදිරියට ගෙනා ශුද්ධ ණය ගැනියන්		(164,726,278)	(208,013,573)
ගෙවූ බදු		(43,393,781)	(13,917,809)
ගෙවූ පාරිතෝෂික		-	(1,052,973)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් උපදවන ලද/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්		**22,312,485**	**16,681,000**
ආයෝජන ක්‍රියාකාරකම් මගින් ලද මුදල් ප්‍රවාහ	10		
මිලදී ගැනීම් දේපල පිරියත සහ උපකරණ		(11,531,325)	(43,199)
දේ.පි.සහ උ. විකිණීම මගින් ඉදිරියට ගෙනා			
අසපෘෂ්‍ය වත්කම් ශුද්ධ මිලදී ගැනීම්		-	-
ශුද්ධ ආයෝජන		87,058,333	350,000,000

ලැබුණු ආයෝජන ආදායම්		103,285,392	107,995,643
ආයෝජන ක්‍රියාකාරකම් මගින් උපදවන ලද/(භාවිතා කරන ලද) ශුද්ධමුදල්		**178,812,400**	**457,952,443**
මූල්‍යක්‍රියාකාරකම් මගින් ලද මුදල් ප්‍රවාහ			
ගෙවන ලද පොලී වියදම්		(261,994,327)	(440,222,374)
ශුද්ධ ණය ගැනීම්			
මූල්‍ය ක්‍රියාකාරකම් මගින් උපදවන ලද/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්		(261,994,327)	(440,222,374)
මුදල් සහ මුදල් සමානදෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		**(60,869,441)**	**34,411,070**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ		121,162,801	86,751,731
වර්ෂාවසාන මුදල් සහ මුදල් සමාන දෑ		**60,293,360**	**121,162,801**
බැංකු අයිරා ශේෂය	11	96,667,455	121,162,801
	19	(36,374,095)	-
Overdraft balance with bank		**60,293,360**	**121,162,801**

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතවලට අනුව හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය පහත පරිදි වේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල		
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය		
2023 දෙසැම්බර්31 අවසන් වසර සඳහා		
	රඳවාගත් ඉපයුම්	මුළු හිමිකම්
	රු	රු
2021දෙසැම්බර්31 දිනට ශේෂය	(37,315,702)	(37,315,702)
ප්‍රතිප්‍රකාශිත ගැලපීම	230,284,678	230,284,678
	192,968,976	**192,968,976**
2022 ජනවාරි 01 දිනට	192,968,976	192,968,976
හිමිකම් ගැලපීම	2,286,606	2,286,606
වෙනත් ආදායම්	2,736,062	2,736,062
ප්‍රතිප්‍රකාශිත අලාභය	(531,684,696)	(531,684,696)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**(333,693,053)**	**(333,693,053)**
2023 ජනවාරි 01 දිනට	(333,693,053)	(333,693,053)
හිමිකම් ගැලපීම **2023**	(66,751,063)	(66,751,063)
වර්ෂය සඳහා ආදායම	59,742,784	59,742,784
වෙනත් ආදායම්	(2,162,836)	(2,162,836)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**(342,864,168)**	**(342,864,168)**

මූල්‍ය ප්‍රකාශ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. වාර්තා කරනු ලබන ආයතනය

1.1 සාමාන්‍ය තොරතුරු

දේශීය ණය සහ සංවර්ධන අරමුදල යනු (දේ.ණ.සහ.සංඅ) 1916 අංක 22 දරණ දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ආඥා පණත මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. එහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ කොළඹ 7 වෝඩ් පෙදෙසෙහි අංක 24 ඒ යන ස්ථානයෙහිය.

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් හී ස්වභාවය

මෙකී අරමුදලෙහි ප්‍රධාන කර්තව්‍යය වනුයේ පොදු පහසුකම් උදෙසා පළාත් පාලන ආයතනවලට (කොළඹ හැර) ණය පහසුකම් සම්පාදනය කිරීමය. දේශීය ණය සංවර්ධන අරමුදලේ ඉලක්කය වනුයේ දේශීය මට්ටමේ යටිතල පහසුකම් සඳහා මූල්‍යනය කරනා නියමු මූල්‍ය ආයතනයක් බවට පත්වීමය.

2. සැකසීමේ පදනම

2.1 ඒකාබද්ධකිරීම සඳහා පදනම

දේශීය ණය සංවර්ධන අරමුදලේ, නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියේ, බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතියේ සහ පලාත් පාලන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ උප කර්තව්‍යයන් ලෙස සෘජු ආදායම් සහ වියදම් වෙන වෙනම ක්‍රියාත්මක කර වසර අවසානයේ දී ඒකාබද්ධ කරනු ලබනාකොටස් හඳුනාගනු ලබයි. වත්කම් සහ වගකීම් ද ශේෂ පත්‍රයහි ඒකාබද්ධ කරනු ලැබේ.

2.2 ප්‍රතිප්‍රකාශනය කිරීම

අරමුදල විසින් පෙර ඉදිරිපත් කරන ලද 2021, 2022 වර්ෂවල දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා ඊට අදාළ සියලුම සටහන් නැවත ලබා දී ඇත. අරමුදලේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කිරීම කළමනාකරණය විසින් කලින් හඳුනාගෙන ඇති සියලුම දෝෂ නිවැරදි කිරීම ඇතුළුව අරමුදලේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම් වාර්තා අභ්‍යන්තර සමාලෝචනයකින් පසුව සිදු කරන ලදී. වෙනසට භාජනය වූ එක් එක් මූල්‍ය ප්‍රකාශන අයිතමයන් පෙර කාලපරිච්ඡේද සඳහා යළි සකස් කිරීමෙන් දෝෂ නිවැරදි කර ඇත.

2.3.ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

ඒකාබද්ධ මූල්‍යයන් ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කරනු ලබන අතර සියළු වටිනාකම් වෙනත් ආකාරයකට දක්වා නොමැති සෑම අවස්ථාවකදීම ආසන්නතම රුපියලට ගණන් බලා ඇත.

2.4.අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ව්‍යාපාර වස්තුවල වෙනස් වීම පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් යන ලේඛන වලින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශය සමන්විත වන අතර ඒවා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකසන ලද ශ්‍රී ලංකාගිණුම්කරන ප්‍රමිති වලට අනුකූලව සකසා ඉදිරිපත් කර ඇත. (SLFRSs and LKASs)

2.5 මූල්‍යප්‍රකාශ පිලිබඳ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූල වන සේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩලය වගකීමට බැඳෙයි. මෙකී වගකීමට පහත අංශ ඇතුලත් වේ. වංචා සහ වැරදි හේතුවෙන් සිදුවිය හැකි වැරදි ප්‍රකාශයන්ගෙන් තොරව ප්‍රකාශන පිලියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

2.6 කොමසාරිස් මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා වන අරමුදලේ මූල්‍ය ප්‍රකාශ 2024 පෙබරවාරි 27 දින කොමසාරිස් මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

2.7. මිණුම් සඳහා වන පදනම

මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශයෙහි දැක්වෙන පහත සඳහන් ද්‍රව්‍යමය අයිතමයන් හැරුණු විට අරමුදලේ මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය පදනම මත පිලියෙල කර ඇත.

අයිතම	මිණුම් සඳහා වන පදනම
නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැඳීම්	සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කල පසු නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැඳීම් හී වර්තමාන වටිනාකම හඳුනාගැනීම

2.8. කැපී පෙනෙනා ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිතා කිරීම සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හී වාර්තාකරණ ලද ප්‍රමාණයන්ට බලපානු ලබනා විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සැකසීමට කළමණාකරනයට අවශ්‍ය වන්නාවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම. මෙකී ඇස්තමේන්තු වලට වඩා තථ්‍යප්‍රතිඵල වෙනස් විය හැකිය. පෙර කාල පරිච්ඡේදයට අදාලව වාර්තා කරන ලද ඇතැම් සංඛ්‍යාවන් වැරදි නිවැරදි කිරීමේ අරමුණින් නැවත ප්‍රකාශ කර ඇත.ඇස්තමේන්තු සහ වැදගත් උපකල්පනයන් අඛණ්ඩ පදනමින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබනා සහ බලපානු ලබනා අනාගත කාල පරිච්ඡේදයන් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු පිලිබඳ සංශෝධනයන් හඳුනා ගැනේ.ඇස්තමේන්තු කරනු ලබනා වඩාම වැදගත් කලාප, අරමුදලේ මූල්‍ය ප්‍රකාශනයන්හී හඳුනාගනු ලබන ප්‍රමාණයන්ට ඉහලම වැදගත් බලපෑම කරනා ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිතා කිරීමෙදී වන අවිනිශ්චිතතා සහ තීරක විනිශ්චයන් පහත පරිදි දැක්වේ.

2.8.1. අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ගිණුම්කරන පදනම

අඛණ්ඩ පදනමින් ක්‍රියාත්මක වීම සඳහා අරමුදලට ඇති හැකියාව පිලිබඳව කොමසාරිස් මණ්ඩලය විසින් තක්සේරුවක් කර ඇති අතර පුරෝකථිත අනාගතය තුළ ඊට අඛණ්ඩව ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට මණ්ඩලය සෑහීමට පත්ව ඇත. තවද අඛණ්ඩ පදනමින් අරමුදලට ක්‍රියාත්මක වීමට වැදගත් බලපෑමක් කළ හැකි කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවක් ගැන මණ්ඩලය නොදන්නා අතර අරමුදලේ මෙහෙයුම් නවතා ලීමට හෝ ඇවර කිරීමට ඔවුහු අපේක්ෂා නොකරති. එහෙයින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනමින් අඛණ්ඩව පිලියෙල කෙරේ.

2.8.2. බදුකරණය

අරමුදල ආදායම් බදුවලට යටත්වන අතර මෙකී මූල්‍ය ප්‍රකාශනයන් පිලියෙල කරනු ලබන අවස්ථාව වන විට අදාල වන්නාවූ බදු නීති පිලිබඳ නිර්වචනයන්ට අදාලව පවතින අවිනිශ්චිතතා හේතුවෙන් වර්තමාන, විලම්බිත සහ අනෙක් බදු නීර්ණය කිරීමට විනිශ්චයක් අවශ්‍ය වේ.

2.8.3. පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම්

පුරෝකථිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වසරේ පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම සහ අදාල ගාස්තුව තීරණය කරනු ලබයි.ඇගයුම් ක්‍රමය වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාත ආදිය පිලිබඳ උපකල්පනයන් සමග සම්බන්ධ වේ. මෙකී වගකීම්වල දීර්ඝ කාලීන ස්වභාවය මත මේ ඇස්තමේන්තු කැපීපෙනෙනා අවිනිශ්චිතතාවන්ට යටත් වේ. සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයකදීම සියළු උපකල්පනයන් සමාලෝචනය කරනු ලබයි.

2.8.4. දේපල, පිරියත සහ උපකරණයන්හී ප්‍රයෝජනවත් ආයු කාලය

සෑම වාර්තාකරණ දිනයකදීම අරමුදල වත්කම් හී ශේෂ වටිනාකම්, ප්‍රයෝජනවත් ආයු කාලය, ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙකී වටිනාකම්, අනුපාත, ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී කළමණාකරනයේ විනිශ්චය භාවිතා කරන අතර එහෙයින් එය අවිනිශ්චිතතාවන්ට යටත් වේ.

2.9. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

2.9.1. බදුකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක - LKAS 12 (ආදායම් බදු) අනුව, වර්තමාන සහ විලම්බිත බදුකරණය සම්බන්ධයෙන් වන කාලපරිච්ඡේදය සඳහා ලාභ හෝ අලාභ තීරණය කිරීමේදී ඇතුලත් කරනා ප්‍රමාණයේ එකතුව බදු වියදම වේ. හිමිකම් තුළ සෘජුවම හඳුනාගන්නා අයිතමයන්හට හෝ හිමිකම් හෝ අනෙක් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගන්නා අවස්ථාවන්හිදී අනෙක් විස්තීර්ණ ආදායම් දක්වා අදාල වන දුර හැර බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි ආදායම් බදු වියදම හඳුනා ගැනේ.

(අ) වර්තමාන බදු

පනවන ලද බදු අනුපාත හෝ බදු නීති හෝ වාර්තාකරණ දිනයෙහිදී සැලකිය යුතු ලෙස පනවනු ලබන සහ පූර්ව වර්ෂවලට අදාලව ගෙවිය යුතු බදුවලට කරනා කවර හෝ ගැලපුම් භාවිතා කරමින් පවත්නා වර්ෂයට අදාලව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ගෙන් අය කරගනු හෝ ඔහුට ගෙවනු ලබන්නට අපේක්ෂා කරනා ප්‍රමාණයන්ගෙන් වර්තමාන බදු වත්කම් සහ වගකීම් සමන්විත වේ.

ඒ අනුව 2006 අංක 10 දරණ දේශීය ආදායම් පණතේ විධිවිධාන සහ මූල්‍ය ප්‍රකාශනයන්හී 10.2 සටහනේ විශේෂයෙන් දක්වා ඇති අනුපාත පිලිබඳ සංශෝධනයන් අනුව බදු කාර්යය සඳහා ගැලපුම් කරන ලද ලාභය මත බදු සඳහා ප්‍රතිපාදන සැපයේ.

(ආ)විලම්බිත බදුකරණය

වත්කම් සහ වගකීම් වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරන කාර්යය උදෙසා ඒවායේ ඉදිරියට ගෙනා වටිනාකම් අතර වාර්තාකරණ දිනයට පවත්නා තාවකාලික වෙනස්කම් මත විලම්බිත බදු සම්පාදනය කෙරේ.

පනවනු ලැබ ඇති හෝ වාර්තාකරණ දිනය වන විට සැලකිය යුතු ලෙසින් පනවනු ලබනා නීති මත පදනම්ව, තාවකාලික වෙනස්කම් ආපසු හරවන අවස්ථාවේදී තාවකාලික වෙනස්කම් සඳහා අදාල කරගැනීමට අපේක්ෂිත බදු අනුපාත අනුව විලම්බිත බදු මනිනු ලැබේ.

වර්තමාන බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක හිමිකමක් තිබේ නම් විලම්බිත බදු වත්කම් සහ වගකීම් හිලවු කරනු ලබන අතර ඒවා එකම බදු අයකල හැකි ව්‍යාපාරයෙහි එකම බදු අධිකාරිය හෝ වෙනස් බදු අධිකාරීන් විසින් අයකරනු ලබනා ආදායම් බදුවලට අදාල වේ. නමුදු ශුද්ධ පදනමක් මත වර්තමාන බදු වත්කම් සහ වගකීම් පියවීමට අදහස් කෙරෙන අතර නැතිනම් බදු වත්කම් සහ වගකීම් එකවරම මුදල් කෙරේ.

භාවිතා කල හැකි දෙයට පටහැනිව තිබිය හැක්කාවූ අනාගත බදු අයකල හැකි ලාභයක පැවතිය හැකිදුරක් දක්වා භාවිතා නොකරන ලද බදු හානි, බදු ණයසහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කමක් හඳුනා ගැනේ. සෑම වාර්තාකරණ දිනයකදීම විලම්බිත බදු සමාලෝචනය කරනු ලබන අතර තව දුරටත් අදාල බදු ප්‍රතිලාභ අත්කරගත නොහැකි දුරක් දක්වා අඩු කෙරේ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි විලම්බිත බදු වගකීම්වල ඉදිරියට ගෙනා වටිනාකම් හී ශුද්ධ වැඩිවීම විලම්බිත බදු වියදම් ලෙස හඳුනාගන්නා අතර ඊට විලෝම වශයෙන් කවර ශුද්ධ අඩුවීමක් වුව විලම්බිත බදු වියදම් ආපසු හැරවීමක් ලෙස හඳුනා ගැනේ.

2.9.2. මුදල් සහ මුදල සමාන ද

මුදල් සහ මුදල සමාන දෑ යනුවෙන් අදහස් කෙරෙනුයේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ක්ෂණිකව මුදල බවට හැරවිය හැක්කාවූ කෙටිකාලීන ආයෝජන සහ වටිනාකම් මාරුවේදී සුළු මට්ටමේ අවදානමකට යටත් වන්නාවූ දෑ ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් ගත් කළ මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල්, බැංකු වල ඇති තැන්පතු ගෙවිය යුතු ශුද්ධ බැංකු අයිරාවන් යනාදියෙනි. එසේම අත්පත් කරගත් දිනට සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් ඇතුලත කල්පිරෙන්නාවූ මූල්‍ය උපකරණයන්ද මුදල් සමාන දෑ යන්නට ගැනේ.

2.9.3. දේපල, පිරියත සහ උපකරණ පිරිවැය

දේපල, පිරියල සහ උපකරණ පසුව එන කවර හෝ සමුච්චිත ක්ෂය සහ කවර හෝ පසු සමුච්චිත අපහායනය හානි අඩු කල පිරිවැයට දැක් වේ. සියළුම ආකාරයේ දේපල, පිරියත සහ උපකරණ පලමුව වාර්තා කරනු ලබන්නේ පිරිවැයටය. දේපල, පිරියත සහ උපකරණ යනු ඒ වත්කම් අපේක්ෂිත පාවිච්චියට ගත හැකි වන මට්ටමට ගෙන ඒමේ දී දරන්නට සිදු වන වියදම් ද ඇතුළුව එකී වත්කම්හි අත්පත් කර ගැනීමේ හෝ ඉදි කිරීමේ පිරිවැයයි. අනෙක් සියළුම අළුත් වැඩියා සහ නඩත්තු පිරිවැයහට ගන්නා අවස්ථාවේ දී ලාභ හෝ පිඩු ලෙස හඳුනා ගනු ලබයි.

ක්ෂය

හීනවන ක්ෂය ක්‍රමය භාවිතා කරමින් භාවිතා කළ හැකි ජීව කාලය මත වත්කමෙහි ඉතිරි වටිනාකම අඩුකර පිරිවැය ලියා හැරිය හැකිවනසේ ක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගන්නා අතර මිලට ගත් වසරේදී ක්ෂය ප්‍රතිපාදන නොකරනු ලබයි. ඇස්තමේන්තු ගත භාවිත කාලය, ඉතිරි වටිනාකම සහ ක්ෂය ක්‍රමය සෑම වසරක් අවසානයේ හව්‍යතා පදනමකින් ඇස්තමේන්තුවේ කවර හෝ වෙනස්වීමක බලපෑම සලකමින් සමාලෝචනය කරනු ලබයි. දේපල, පිරියත සහ උපකරණයන්හී ඇස්තමේන්තුගත භාවිත ජීව කාලය පහත පරිදි වේ;

ස්පෘෂ්‍ය වත්කමෙහි පංතිය	භාවිතා කල හැකි ජීව කාලය
ලී බඩු සහ උපකරණ	වසර 10
කාර්යාල උපකරණ	වසර 5
පරිගණක සහ මෘදුකාංග	වසර 4
මෝටර්වාහන	වසර 5

නැවත හඳුනාගැනීම

අපහරණය කරනු ලබන අවස්ථාවේදී හෝ වත්කමෙන් එහි භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවන්හිදී දේපල, පිරියත සහ උපකරණ නැවත හඳුනාගැනීම කරනු ලබයි. කිසියම් දේපල,පිරියත හෝ උපකරණ නැවත හඳුනාගැනීමකදී වන ලාභ හෝ පාඩුව තීරණය කරනු ලබන්නේ වත්කමෙහි විකුණුම් මුදල සහ ඉදිරියට ගෙනා වටිනාකම අතර වෙනස මගිනි. එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගනු ලබයි.

2.9.4. ගෙවිය යුතු සහ ලැබිය යුතු ණය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම

ගෙවිය යුතු ණය මගින් නිරූපණය වනුයේ පළාත් පාලන ආයතන වෙත ලබාදීම සඳහා 'ආ' සංරචකය යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ ණය සමග LGIIP ව්‍යාපෘතිය වෙතින් ලැබෙනා ශ්‍රී ලංකා රජයේ අරමුදල්ය. ලැබිය යුතු ණය මගින් නියෝජනය වනුයේ ණය සංරචකය සමග පලාත් පාලන ආයතන වෙත බෙදා හැරි ප්‍රදානයන්ය. වියදමක් ලෙස සලකනු ලබන ලැබිය යුතු ණය ප්‍රදාන එකී ක්‍රියාකාරකමෙන් පොලී ලැබෙනා වසර ගණනාව පුරා ක්‍රමානුකූල පිලිවෙලකට ආදායම් ප්‍රකාශය තුළ විලම්භනය සහ ක්‍රමක්ෂය කරනු ලබයි. ගෙවිය යුතු ණයද මේ ක්‍රමය යටතේම ක්‍රමක්ෂය කරනු ලබයි. මෙහිදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ඒකාබද්ධ බදුවලට පෙර ලාභය බදුපෙර සහ ශුද්ධ ක්‍රමක්ෂය ලාභයෙන් 5% ට වඩා අඩු නොවිය යුතුය.

2.9.5. වට්ටෝරු බඩු

වට්ටෝරු බඩු මගින් රුපියල් 5000 ට වඩා අඩු වටිනාකමින් යුත් අයිතමයන් නියෝජනය කෙරෙන අතර ඒවා දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගත නොහැකිය. තවද වට්ටෝරු බඩු පොතෙහි වර්ගීකරණය පිණිස වත්කමෙහි ජීවිකාලය සැලකිල්ලට ගනු ලබයි. යම් වත්කමක ජීව කාලය සැලකිය යුතු දුරකට ගමන් නොකරන්නේ නම් එහි පිරිවැය වියදමක් ලෙස සලකා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබයි.

2.9.6. පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම්

(ඒ) තීරණය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම -පාරිතෝෂික

පාරිතෝෂික යනු නීර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුමකි. අරමුදල වාර්ෂිකව පාරිතෝෂික ලෙස පොරොන්දුව ඇති විශ්‍රාම ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම ගණනය කර බලයි. එය නීර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුමකි. නීර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ සැලසීම පිණිස වන පිරිවැය තීරණය කරනු ලබන්නේ ආයු ගණක තක්සේරුකරුවකුගේ විශේෂඥ දැනුම භාවිතා කරමින් ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය මගිනි.

නීර්ණය කරනු ලබන ප්‍රතිලාභ සැලසුමක ආයුගණක වාසි සහ පාඩු වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හටගන්නා කාල පරිච්ඡේදය තුළ පූර්ණ ලෙසම හඳුනා ගැනේ. මෙකී පාරිතෝෂික වගකීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර අරමුදල් නොසැපයේ.

(ඉ) නීර්ණය කරන දායකත්ව සැලසුම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට අදාල නීති රීති හා රෙගුලාසි වලට අනුව සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායකත්වයන් ගෙවීමට සේවකයන්ට හිමිකම් ලබයි.

2.9.7. ප්‍රතිපාදන

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අරමුදලට වර්තමාන බැඳීමක් (නෛතික හෝ සකාර්ය) ඇති විට සහ එකී බැඳීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් බැහැරට ගලා යායුතු වන්නාවූ තත්වයක් පවතින විට මෙන්ම එකී බැඳීමෙහි ප්‍රමාණය සම්බන්ධයෙන් විශ්වසනීය ඇස්තමේන්තුවක් පිලියෙල කිරීමට හැකි විටක ඒ සඳහා ප්‍රතිපාදන හඳුනා ගැනේ.

2.9.8. වෙනත් මූල්‍ය නොවන වත්කම්

වෙනත් සියළු මූල්‍ය නොවන වත්කම් එහි ඉදිරියට ගෙනා වටිනාකම ඇස්තමේන්තුගත මුදල් කල හැකි වටිනාකමට අඩු කළ හැකිවන සේ අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂිත ප්‍රතිපාදන මත අගයනු ලැබේ.

2.9.9. වෙනත් මූල්‍ය නොවන වගකීම්

වෙනත් මූල්‍ය නොවන වගකීම් එහි සාමාන්‍ය ප්‍රමාණය අනුව හඳුනා ගැනේ.

2.9.10. මූල්‍ය නොවන වත්කම් අපහායනය

කිසියම් වත්කමක් සඳහා අපහායනයක් පිලිබඳ අවශ්‍යතාවක් වේදැයි බලා ගනු පිණිස අරමුදල සෑම වාර්තාකරණ දිනයකම තක්සේරුවක් සිදු කරයි. එසේ අපහායනයක් කළ යුතු යයි ඇඟවුමක් වේ නම් එසේත් නැතිනම් කිසියම් වත්කමක් සඳහා වාර්ෂික අපහායන පරීක්ෂාවක් අවශ්‍ය වේ නම් අරමුදල වත්කමෙන් අයකරගත හැකි වටිනාකම සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු කරයි. යම් වත්කමක එසේ අයකරගත හැකි වටිනාකම එකී වත්කමෙහි භාවිත වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කල පසු සාධාරණ අගයට වඩා වැඩි විය යුතුය. අනෙක් වත්කම් හෝ වත්කම් සමූහයන් ගෙන් විශාල වශයෙන් ස්වාධීන වන්නාවූ මුදල් ගලා ඒමක් උත්පාදනය නොවන්නේ නම් තනි තනි වත්කම් ලෙස ගැනීමට තීරණ කරනු ලබයි. කිසියම් වත්කමක ඉදිරියට ගෙනා වටිනාකම එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවා යන අවස්ථාවන්හිදී වත්කම අපහායනය කරන ලදැයි සැලකෙන අතර එය එහි අයකරගත හැකි වටිනාකමට ගිණුම්ගත කරනු ලබයි.

2.9.11. මූල්‍ය උපකරණ-මූලික හඳුනාගැනීම සහ අනුෂාංගික මිණුම්

අරමුදලේ මූල්‍ය උපකරණ ණය, ලැබිය යුතු දෑ සහ වෙනත් මූල්‍ය වගකීම් වලින් සමන්විත වන අතර එහි අනුෂාංගික මිණුම් අපහායනය සහ නැවත හඳුනාගැනීම් පිලිබඳ ගිණුම්කරන ප්‍රතිපත්ති පහත දැක්වේ.

i) මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 39 තුළ, මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය සුදුසු ලෙස තීරණය කරනු ලබන ආකාරයට ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරෙනතුරු රඳවාගන්නා ආයෝජන සහ විකුණුම් සඳහා ඇති මූල්‍ය වත්කම් තුළින් සාධාරණ අගය මත මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණයට ලක් කෙරේ. සියළු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ අගය සහ (සාධාරණ අගය මත නොමැති වත්කම් සම්බන්ධයෙන් ලාභ හෝ අලාභ මත) සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයෙහි එකතුව මත හඳුනා ගැනේ.

ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළඳපලෙක මිල සඳහන් නොවන ස්ථාවර හෝ නීර්ණය කල හැකි ගෙවුම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ආරම්භක මිණුම්න් පසු අපහායන අගය අඩු කර සඵලදායි පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් එවන් මූල්‍ය වත්කම් පසුව ක්‍රමක්ෂය පිරිවැය මත පසුව මණිනු ලැබේ. මෙකී ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත්කර ගැනීම මත වන වට්ටම් හෝ වාරික සහ සඵලදායි පොලී අනුපාතයෙහි ඒකාබද්ධ කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. මෙකී සඵලදායි පොලී අනුපාත ක්‍රමයයටතේ වන ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම තුළ ඇතුලත් වේ. අපහායනයෙන් පැන නගින්නාවූ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ණය සහ ලැබිය යුතු දෑ මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි ඉදිරිපත් කෙරේ.

නැවත හඳුනාගැනීම

පහත අවස්ථාවලදී මූල්‍ය වත්කමක් හඳුනාගැනේ (එසේ නැතිනම් අදාල වන පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්)

වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති අයිතිය කල්පැන ඇති විට,

අරමුදල වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති තම අයිතිය මාරු කර ඇති විට හෝ තෙවන පාර්ශවයකට ‘pass-through’ වැඩ පිලිවෙලක් හරහා භෞතික ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහයත් පූර්ණ වශයෙන්ම වගකීමක් සඳහා ගෙවීමට භාරගෙන ඇති විට සහ

(අ) අරමුදල වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම මාරු කර ඇති විට හෝ

(ආ) අරමුදල වත්කමෙහි සියළු අවදානම් හෝ ප්‍රතිලාභ බොහෝ කොට මාරු කර හෝ රඳවා තබාගෙන නොමැති එහෙත් වත්කමෙහි පාලනය මාරු කර ඇති විට නැවත හඳුනාගැනීම කරනු ලැබේ.

මූල්‍ය වත්කම් අපහායනය

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 අනුව හානිකරණ ගාස්තු

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නොලැබෙන පහත සඳහන් මූල්‍ය උපකරණවල අපේක්ෂිත මූල්‍ය අලාභය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදල විසින් පාඩු දීමනා හඳුනාගනී.

- මුදල් හා මුදල් සමාන දෑ,
- බැංකු සමඟ ස්ථානගත කිරීම්,
- අනෙකුත් පාරිභෝගිකයන් වෙත ණය හා අත්තිකාරම්

ණය අවදානම් තක්සේරු කිරීම හා අපේක්ෂිත මූල්‍ය අලාභය ඇස්තමේන්තු කිරීම අපක්ෂපාතී හා සම්භාවී විය යුතු අතර අතීත සිදුවීම්, වර්තමාන තත්ත්වයන් හා වාර්තා කරන දිනයේ ආර්ථික තත්ත්වයන් පිළිබඳ සාධාරණ හා අනුබල දෙන පුරෝකථනයන් පිළිබඳ තොරතුරු ඇතුළුව තක්සේරුවට අදාළ සියලු තොරතුරු ඇතුළත් කළ යුතුය. මීට අමතරව, අපේක්ෂිත මූල්‍ය අලාභ ඇස්තමේන්තුවේදී මුදලේ කාල වටිනාකම සැලකිල්ලට ගත යුතුය.

ගනුදෙනුකරුවන්ගේ ණය හා අත්තිකාරම් මත හානිකරණ ගාස්තු

පූර්ව නිශ්චිත සීමාවකට වඩා වැඩි ණය හා අත්තිකාරම් සඳහා ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් දේශීය ණය සංවර්ධන අරමුදල විසින් වෙන් වෙන්ව තක්සේරු කරයි. යම් ණයක් වෙන් වෙන්ව හානිකරණය වී ඇත්නම්, අලාභයේ ප්‍රමාණය වත්කම රැගෙන යන මුදල හා අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරයි. දේශීය ණය සංවර්ධන අරමුදල විසින් එක් හානියක් යටතේ ප්‍රතිපාදන අවශ්‍ය නොවන බව තීරණය කරන්නේ නම්, එවැන් මූල්‍ය වත්කම් ඉතිරි කළඹ හෝ පොකුරු සමඟ කිසියම් හාන්කරණයක් සඳහා සාමූහිකව තක්සේරු කරනු ලැබේ.

දේශීය ණය සංවර්ධන අරමුදල ප්‍රධාන කොටස් තුනක් භාවිතා කරමින් අපේක්ෂිත මූල්‍ය අලාභය ගණනය කරයි. එනම්, පැහැර හැරීම් සම්භාවිතාව (PD), පැහැරහැරීමේ පාඩුව (LGD) හා සාමූහික තක්සේරුව යටතේ පැහැරහැරීම් නිරාවරණයයි (EAD). මෙම පරාමිතීන් සාමාන්‍යයන් ව්‍යුත්පන්න කර ඇත්තේ අභ්‍යන්තර සංවර්ධිත සංඛ්‍යාන ආකෘති හා ඓතිහාසික දත්ත වලින් වන අතර පුසව ඉදිරි තොරතුරු පිළිබිඹු වන ලෙස සකස් කර ඇත.

-පැහැරහැරීමේ පාඩුව (LGD) - පැහැර හැරීමේ පාඩුව යනු යම් අවස්ථාවකදී පැහැර හැරීමක් සිදුවූ විට ඇතිවන පාඩුව පිළිබඳ ඇස්තමේන්තුවකි. එය පදනම් වන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් හා ණය දෙන්නාට ලැබෙයැයි අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනස මතය. දේශීය ණය සංවර්ධන අරමුදල විසින් පැහැර හැරීමේ පාඩු පරාමිති ඇස්තමේන්තු කරන්නේ පැහැර හරින ලද ප්‍රති පාර්ශවයන්ට එරෙහිව හිමිකම් පෑමේ ඓතිහාසික ප්‍රතිසාධන අනුපාතය මත පදනම්වය. වට්ටම් සාධකය ලෙස ඵලදායී පොළී අනුපාත භාවිතා කරමින් වට්ටම් සහිත මුදල් ප්‍රවාහ පදනම මත ඒවා ගණනය කරනු ලැබේ. පැහැරහැරීමේ පාඩුව සාමාන්‍යයන් පැහැරහැරීම් නිරාවරණයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කෙරේ.

- පැහැරහැරීම් නිරාවරණය (EAD) – පැහැරහැරීම් නිරාවරණය වීම, පැහැරහැරීමකදී අපේක්ෂිත නිරාවරණය පෙන්නුම් කරයි. දේශීය ණය සංවර්ධන අරමුදල විසින් පැහැරහැරීම් නිරාවරණ ඇස්තමේන්තු කරනු ලබන්නේ වාර්තා කරන දිනයේ සිට පැහැරහැරීම් සිදුවීම දක්වා මූලික හා පොළී අපසු ගෙවීම හා කැපකළ පහසුකම්වල අපේක්ෂිත අඩු කිරීම් සැලකිල්ලට ගනිමිනි. අදියර 1 ණයක් සඳහා පැහැරහැරීම් නිරාවරණය ගණනය කිරීමට දේශීය ණය සංවර්ධන අරමුදල විසින් මාස 12 ක් ඇතුළත සිදුවිය හැකි පැහැරහැරීම් සිදුවීම් තක්සේරු කරයි. අනෙකුත් සියලුම ණය සඳහා මූල්‍ය උපකරණයේ ආයු කාලය පුරාවටම පැහැරහැරීම් සිදුවීම් සඳහා පැහැරහැරීම් නිරාවරණය සලකා බැලේ.

- - පැහැරහැරීම් සම්භාවිතාව (PD) - පැහැරහැරීමේ සම්භාවිතාව නියෝජනය කරන්නේ ණය ගැණුම්කරුවකු ඉදිරි මාස 12 හෝ වගකීමේ ඉතිරි ආයු කාලය තුළ තම මූල්‍ය වගකීම් පැහැරහැරීමේ සම්භාවිතාවයි. පැහැරහැරීමේ සම්භාවිතා ඇස්තමේන්තු නිශ්චිත දිනයක ඇස්තමේන්තු කරන අතර නිරාවරණය සඳහා පැහැරහැරීමේ සම්භාවිතාවේ මූලික ආදානය වන්නේ ගෙවිය යුතු දින වේ. ගෙවිය යුතු දින තීරණය කරනු ලබන්නේ නියමිත දින සිට දින ගණන ගණනය කිරීමෙනි. දේශීය ණය සංවර්ධන අරමුදල විසින් රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කිරීම සඳහා සංඛ්‍යානමය ආකෘති භාවිතා කරන අතර ඉතිරි ආයු කාලය නිරාවරණ පැහැරහැරීමේ සම්භාවිතාව සහ කාලයාගේ ඇවෑමෙන් වෙනස්වීමට අපේක්ෂා කරන ආකාරය පිළිබඳ ඇස්තමේන්තු නිර්මාණය කරයි.

ii) මූල්‍ය වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 39 යෙහි විෂය පථය තුළ මූල්‍ය වගකීම් පොලී සහිත ණය දීම් සහ ණය ගැනීම් ලෙස සහ ගැලපෙන පරිදි වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ග කෙරේ. අරමුදල ආරම්භක හඳුනාගැනීමේදී සිය මූල්‍ය වගකීම් වර්ගීකරණයට ලක් කරන ආකාරය තීරණය කරයි.

වගකීමෙහි ගිවිසුම්ගත ප්‍රතිපාදනයට කොටස්කරුවකු බවට අරමුදල පත්වූ විට අරමුදල මූල්‍ය වගකීම් හඳුනාගන්නා අතර මූල්‍ය වගකීම්වල නිර්වචනයන්ට අනුව ගිවිසුම්ගත වැඩපිලිවෙලෙහි හරය අනුව යමින් මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

මූල්‍ය වත්කම් නැවත හඳුනාගැනීම

වගකීම යටතේ වන බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් ඉකුත් වීම මත මූල්‍ය වගකීමක් නැවත හඳුනාගැනේ. පැහැදිලිවම වෙනස් වූ කොන්දේසි මත නැතිනම් පවත්නා වගකීමෙහි කොන්දේසි නවීකරණය කිරීම මත එකම ණය දෙන්නකුගෙන් ගත් වෙනත් ණයක් මගින් පවත්නා මූල්‍ය වගකීම විතැන් කරනු ලබද්දී එවන් නවීකරනයක් මගින් කෙරෙනා හුවමාරුවක් නියම වගකීම නැවත හඳුනාගැනීමක් ලෙසත් නව වගකීමක් හඳුනාගැනීමක් ලෙසත් සලකනු ලබයි. මුල් මූල්‍ය වගකීමෙහි ඉදිරියට ගෙනා වටිනාකම සහ ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාව අතර වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබයි.

2.9.12. ආදායම හඳුනාගැනීම

අරමුදලට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සඳහා ඉඩක් තිබේද යන්න සහ ගෙවීම් කරනු ලබන අවස්ථාව සැලකිල්ලට නොගෙන, ආදායම සහ සිදුවන හෝ සිදුවිය හැකි ආශ්‍රිත පිරිවැය විශ්වසනීය අයුරින් ගණනය කළ හැකිද යන්න තීරණය වන තරම්දුරට ආදායම හඳුනා ගැනේ. ආදායම හඳුනාගැනීමේ කාර්යය උදෙසා පහත සඳහන් විශේෂිත නිර්ණායක උපයෝගී කර ගැනේ.

අ) පොලී ආදායම සහ වියදම්

උපචිත පදනම සහ සඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම සහ වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනාගනු ලබයි. සඵලදායී පොලී අනුපාතය යනු මූල්‍ය වත්කම සහ වගකීමේ ඉදිරියට ගෙනා වටිනාකමට මූල්‍ය වත්කමේ හෝ වගකීමේඅපේක්ෂිත ජීව කාලය තුළින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් සහ ලැබීම් නියත ලෙස වට්ටම් කරනා අනුපාතයයි. (නැතිනම් අදාල වන පරිදි කෙටි කාලය) සඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමේදී අරමුදල අනාගත ණය පාඩු නොව මූල්‍ය උපකරණවල සියළු ගිවිසුම් කොන්දේසි සැලකිල්ලට ගනිමින් අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරයි.

මෙසේ සඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමට ගෙවන ලද හෝ ලැබුණ සියළු ගාස්තු සහ ලකුණු ඇතුලත් වන අතර ඒවා සඵලදායී පොලී අනුපාතයෙහි ඒකාබද්ධ කොටසක් වේ. ගණුදෙනු පිරිවැයට මූල්‍ය වත්කමක් හෝ වගකීමක් අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුව ආරෝපණය කළ හැකි වැඩිවන පිරිවැය ඇතුලත් වේ.

ආ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් ගිණුම් ගත කරනු ලබයි. මෙකී වෙනත් ආදායම් යන්නට දඩ සහ බේරුම් කරන ලද හානි හේතුවෙන් ලත් ආදායම් , ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය සහ අන් කවර හෝ මෙහෙයුම් නොවන ආදායම් ඇතුලත් විය.

2.9.13. වියදම් හඳුනාගැනීම

හටගත් පිරිවැය සහ විශේෂ ආදායම් අයිතමයන්හී ඉපයුම් අතර වන සෘජු සම්බන්ධතාව පදනම් කරගෙන වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ව්‍යාපාර කටයුතු කරගෙන යාමෙන් සහ කාර්යක්ෂම අනුපාතයකින් දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙන් හටගන්නා වියදම් වසරේ ලාභ ලැබීමේදී ආදායමින් අයකර ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය උදෙසා කොමසාරිස්වරුන් දරන මතය වනුයේ වියදම් ක්‍රමවේදයෙහි ස්වභාවය මගින් අරමුදලේ කාර්යසාධනය සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලබන බවත් එහෙයින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අදාල කරගත් බවත්ය.වියදම් සිදුවූ වසර තුළදී අලුත්වැඩියා සහ අලුත් කිරීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ.

2.9.14. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 7 (LKAS-7) මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත.

අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ සාධාරණ අගය තුළ කැපී නොපෙනෙනා අවදානම් වෙනස්වීම් වලට යටත්වන මාස තුනට අඩු කල් පිරීම් සහිත කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීම පිණිස රඳවා ගනු ලබනා ඉහල ද්‍රවශීලතාවකින් යුත් මූල්‍ය වත්කම් යනාදියෙන් මුදල් සහ මුදල සමාන දෑ සමන්විත වේ.

2.9.15. අදාල පාර්ශව අනාවරණයන්

අදාල පාර්ශව සමග ගණුදෙනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ පවත්වාගෙන යනු ලැබේ.

2.9.16. බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

සියළු දැන සිටින වගකීම් ප්‍රමාණයන් තීරණය කිරීමේදී අවබෝධ කරගත හැකි සියළු අවදානම් සැලකිල්ලට ගනු ලැබේ.අසම්භාව්‍ය බැරකම් යනු ඇතිවිය හැකි බැරකම් වන අතර ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම කළ නොහැකි හෝ විශ්වසනීය ලෙස මැණිය නොහැකි විටදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් මගින් පමණක් ඒවායේ පැවැත්ම තහවුරු කෙරේ. අසම්භාව්‍ය බැරකම් මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි හඳුනා නොගන්නා නමුදු ඒවා දුරස්ථ නොවේ නම් අනාවරණය කෙරේ.

2023 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා ගිණුම්කරණ සටහන්

4. සටහන- පොලී ආදායම්

	2023	2022
පොලී ආදායම්	රු	රු
ණය සහ අත්තිකාරම් වෙතින් පොලිය	307,142,464	289,204,262
එකතුව	**307,142,464**	**289,204,262**

5. සටහන - පොලී වියදම්

	2023	2022
පොලී වියදම්	රු	රු
භාණ්ඩාගාර ණය ගැනීම් සඳහා පොලී වියදම්	**109,444,196**	**113,769,524**

6. සටහන - වෙනත් මෙහෙයුම් ආදායම්

	2023	2022
වෙනත් මෙහෙයුම් ආදායම්	රු	රු
ආයෝජන ආදායම	122,293,513	151,743,746
සේවක ණය පොළී	862,541	912,887
දඩ ආදායම්(බේරුම්කරන ලද හානි) සහ වෙනත්	7,346,384	443,541
UNDP ප්‍රදානය	8,844,400	12,500,000
එකතුව	**139,346,837**	**165,600,174**

7. සටහන - පුද්ගලික වියදම්

	2023	2022
පුද්ගලික වියදම්	රු	රු
වැටුප් සහ අනෙක් ප්‍රතිලාභ	25,391,519	25,339,210
සේ.අ.අ. සහ සේ.නි.භා. අ	2,664,312	2,831,801
පාරිතෝෂික වියදම්	1,330,950	1,217,798
එකතුව	**29,386,782**	**29,388,809**

8. සටහන - ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම - LGIIP

	2023	2022
ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම-LGIIP	රු	රු
ණය ප්‍රදාන	-	41,258,082
අඩු කළා: ණය ප්‍රදාන	-	11,260,897
ශුද්ධ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම්	-	**29,997,185**

9. සටහන - වෙනත් මෙහෙයුම් වියදම්

	2023	2022
වෙනත් මෙහෙයුම් වියදම්	රු	රු
කාර්යාල පරිපාලන සහ ආයතන වියදම්	15,623,739	12,300,527
වෘත්තීය සහ නෛතික වියදම්	285,045	141,602
විගණක පාරිශ්‍රමිකයන්	494,820	318,000
UNDP වියදම	20,108,562	1,235,838
එකතුව	**36,512,166**	**13,995,967**

10. සටහන - බදු වියදම

	2023	2022
බදු වියදම්	රු	රු
වර්තමාන බදු ප්‍රතිපාදන	36,688,054	36,418,499
වර්තමාන බදු සඳහා අව ප්‍රතිපාදන / (අධි ප්‍රතිපාදන)	-	-
විලම්බිතබදුවියදම්/(ආදායම)	-	-
එකතුව	36,688,054	36,418,499

10.1. සටහන - බදුවලට පෙර ගිණුම්කරන ලාභ / (අලාභ)

	2023	2022
බදු වලට පෙර ගිණුම්කරන ලාභ/(අලාභ)	96,430,838	607,361,533
එකතුකරන ලද අවසර නොදුන් අයිතම	122,184,885	(364,303,528)
එකතුකරනලද අවසර දෙන ලද අයිතම	(3,513,074)	(1,030,779)
ව්‍යාපාරයේ ගැලපුම් කරන ලද ලාභ	215,102,649	242,027,226
පොලී ආදායම්	(122,293,513)	(151,743,746)
මුළු ව්‍යවස්ථාපිත ආදායම	92,809,136	90,283,480
අඩු කළා -අවසර ලත් හානි	(92,809,136)	(90,283,480)
බදු අයකල හැකි ආදායම	-	-

10.2. සටහන - ව්‍යවස්ථාපිත බදු අනුපාතය

	2023	2022
ව්‍යවස්ථාපිත බදු අනුපාතය		
වර්තමාන ආදායම් බදු වියදම	36,688,054	36,418,499
(කාලපරිච්ඡේදය සඳහා බදුවගකීම සහ අනුපාතය - 30%)		

11. සටහන - මුදල් සහ මුදල් සමාන දෑ

	2023	2022
	රු	රු
මුදල් සහ මුදල් සමාන දෑ		
බැංකුවල ඇති ඉතුරුම් තැන්පතු	89,399,331	109,820,895
බැංකුවල ඇති ජංගම තැන්පතු	5,268,124	11,341,906
ආපසු යැවූ මිලදී ගැනීම්	2,000.000	-
එකතුව	**96,667,455**	**121,162,801**

12. සටහන - බැංකු ශේෂය

	2023	2022
	රු	රු
බැංකු ශේෂය		
බැංකුවල ඇති ස්ථාවර තැන්පතු	685,058,333	598,000,000
එකතුව	**685,058,333**	598,000,000

13.සටහන - ණය සහ ලැබිය යුතු දෑ

	2023	2022 ප්‍රතිප්‍රකාශිත	2022
ණය සහ ලැබිය යුතු දෑ			
ලැබිය යුතු ණය (සටහන 13.1)	4,479,316,243	4,597,391,109	4,597,391,109
අඩුකළා :අපහායන සඳහා දීමනා (සටහන 13.2)	1,614,122,723	1,446,561,045	1,333,047,846
එකතුව	**2,865,193,520**	**3,150,830,065**	**3,264,343,263**

13.1. සටහන - විශ්ලේෂණය - (ව්‍යාපෘති මඟින්)

විශ්ලේෂණය - (ව්‍යාපෘති මඟින්)	2023	2022 ප්‍රතිප්‍රකාශිත	2022
	රු	රු	රු
දේශීය ණය සහ සංවර්ධන අරමුදල	2,826,890,344	2,728,984,447	2,728,984,447
LGIIP	313,299,869	381,405,347	381,405,347
PCDP	63,270,510	75,411,862	75,411,862
UDLIHP	1,258,407,512	1,390,026,338	1,390,026,338
NWSDB	0	4,790,505	4,790,505
කාර්යමණ්ඩල ණය	17,448,009	16,772,609	16,772,609
එකතුව	**4,479,316,243**	**4,597,391,109**	**4,597,391,109**

13.2. සටහන - වසර තුළ අපහායන ගාස්තු වලනය

	2023	2022 (ප්‍රතිප්‍රකාශිත)	2022	2021 (ප්‍රතිප්‍රකාශිත)
ජනවාරි 1 දිනට	1,446,561,04	684,762,839	1,673,877,370	1,673,877,370
SLFRS ප්‍රතිපාදන 2021			-	(758,829,854)
වසර තුළ කපා හරින ලද				
වසර සඳහා ගාස්තු	167,561,679	761,798,206	(340,829,524)	(230,284,678)
දෙසැම්බර් 31 දිනට	1,614,122,723	1,446,561,045	1,333,047,846	684,762,839

අපහායන ගාස්තු(Individual)	2023	2022 (ප්‍රතිප්‍රකාශිත)	2022	2021 (ප්‍රතිප්‍රකාශිත)
අදියර 1				
අදියර 2	102,670,731	607,947,540		20,440,583
අදියර 3	952,279,226	393,141,033	906,166,187	334,385,183
මුළු අපහායන ගාස්තු	1,054,949,957	1,001,088,573	906,166,187	354,825,766
අපහායන ගාස්තු(Collective)				
අදියර 1	34,544,994	39,817,993	181,769,137	30,887,378
අදියර 2	91,863,715	76,808,844	25,925,218	13,406,265
අදියර 3	432,764,058	328,845,634	219,187,303	285,643,429
මුළු අපහායන ගාස්තු	559,172,766	445,472,472	426,881,658	329,937,073

14. සටහන - දේපල පිරියත සහ උපකරණ පිරිවැය

ක්ෂය	2023.01.01 දිනට පිරිවැය	එකතු කිරීම්	අපහරණ/මාරු	2023.12.31 දිනට පිරිවැය
කාර්යාල උපකරණ	1,725,753	880,150	-	2,605,903
ලී බඩු සහ උපකරණ	1,748,813	-	-	1,748,813
පරිගණක මෘදුකාංග සහ දෘඩාංග	12,007,797	11,531,325	1,918,700	21,620,423
මෝටර් වාහන	7,995,000	-	-	7,995,000
එකතුව	**23,477,363**	**12,411,475**	**1,918,700**	**33,970,139**
සමුච්චිත ක්ෂය				
විස්තරය	2023.01.01 දිනට ශේෂය	වසර සඳහා ක්ෂය කිරීම්	අපහරණ/මාරු	**2023.12.31** දිනට ශේෂය
කාර්යාල උපකරණ	1,501,933	298,116	-	1,800,049
ලී බඩු සහ උපකරණ	1,237,041	108,089	-	1,345,130
පරිගණක මෘදුකාංග සහ දෘඩාංග	10,912,493	6,747,435	1,918,700	15,741,228
මෝටර් වාහන	7,995,000	-	-	7,995,000
එකතුව	**21,646,467**	**7,153,640**	**1,918,700**	**26,881,407**
ලියා හල අගය	1,830,896			**7,088,731**

15. සටහන - වෙනත් වත්කම්

	2023	2022
වෙනත් වත්කම්	රු	රු
ලැබිය යුතු ඇවර කරන ලද හානි	1,480,731	1,480,731
පළාත් පාලන අධිකාරී වෙත **LGIIP** ප්‍රදාන	0	-
බඩු වට්ටෝරු	163,603	114,083
ලැබිය යුතු ණය පොළී	76,852,323	53,142,999
ලැබිය යුතු ආයෝජන පොළී	19,008,121	43,748,104
ලැබිය යුතු බදු	4,830,604	-
වෙනත් ලැබිය යුතු දෑ	1,200,000	1,206,000
එකතුව	**103,535,383**	**99,691,917**

16. සටහන - පොලී සහිත ණය ගැනීම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ

	2023	2022
පොලීසහිත ණය ගැනීම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ	රු	රු
දේ.ණ.සහ සං. අ	57,072,446	73,095,983
LGIIP	2,843,420,563	2,991,401,014
PCDP	39,445,367	42,791,445
UDLIHP	1,075,068,229	1,156,694,026
එකතුව	**4,015,006,605**	**4,263,982,469**

17. සටහන - වර්තමාන බදු වගකීම

වර්තමාන බදු වගකීම්	2023	2022
	රු	රු
වසර මුල ශේෂය	-	-
එකතු කළා : වර්තමානවසර සඳහා ප්‍රතිපාදන/ප්‍රතිපාදන යටතේ ගැලපුම්	36,688,054	36,418,499
අඩු කළා: වසර තුළ ගෙවීම්	-	-
රඳවාගත් බදු	-	-
එකතුව	**36,688,054**	**36,418,499**

17.1. සටහන - විලම්බිත බදු වත්කම් / (වගකීම්)

විලම්බිත බදු වගකීම් / (වගකීම්)	2023	2022
	රු	රු
විලම්බිත බදු වත්කම්	8,956,310	36,418,499
විලම්බිත බදු වගකීම්	(1,074,357)	433,385
එකතුව	**7,881,953**	**6,143,529**

18. සටහන - පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම

පශ්චාත් සේවානියුක්ති ප්‍රතිලාභ වගකීම	2023	2022
	රු	රු
ජනවාරි **1** දිනට	4,853,001	5,912,476
ආදායම් ප්‍රකාශයෙහිඳුනාගත් ප්‍රමාණය	1,330,950	1,217,798
විස්තීර්ණ ආදායම්යටතේ හඳුනාගත් ප්‍රමාණය	2,188,332	(1,023,134)
වසර තුළ කරන ලද ගෙවීම්	(122,670)	(1,254,140)
දෙසැම්බර් **31** දිනට	**8,249,612**	**4,853,000**

18.1. සටහන - ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගන්නා ලද ප්‍රමාණය

	2023	**2022**
ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගන්නා ලද ප්‍රමාණය		
වර්තමාන සේවා පිරිවැය	873,540	853,554
පොලී පිරිවැය	457,410	364,244

එකතුව	1,330,950	1,217,798

18.2 සටහන - පොලී අනුපාතය

පොලී අනුපාතය	**13.00%**	**18.00%**
වැටුප් වර්ධක අනුපාතය	Fixed increment per annum	Fixed increment per annum
කාර්ය මණ්ඩල පිරිවැටුම	3.00%	6.00%
විශ්‍රාමික වයස	60 years	60 years

18.3. සටහන - ගණනය කිරීමේදී යොදා ගන්නා උපකල්පනයන්ගේ සංවේදීතාව

උපකල්පන	වට්ටම් අනුපාතය	
සංවේදී මට්ටම	**1%** වැඩිවීම	**1%** අඩුවීම
නිර්වචනය කරන ලද වගකීම් මත වන බලපෑම	5,526,951	6,348,825

19. සටහන - වෙනත් වගකීම්

	2023	2022
වෙනත් වගකීම්	රු	රු
ශ්‍රී ලංකා රජයේ ප්‍රදාන	-	(0)
UNDP ප්‍රාග්ධන ප්‍රදාන	6,687,871	673,453
ගෙවිය යුතු විලම්බිත බදු	-	-
කලින් ගෙවූණයගැතියෝ සහ අත්තිකාරම්	4,210,086	6,567,344
බැංකුව සමඟ මුදල් ශේෂය	36,374,095	-
වෙනත් ගෙවිය යුතු	1,073,219	570,423
එකතුව	**48,345,271**	**7,811,220**

20.සටහන - වියදම් බෙදීඩනය

වියදම් බෙදීඩනය	2023	2022
පුද්ගල වියදම්	රු	රු
කාර්ය මණ්ඩල වැටුප්	16,900,305	18,078,495
ගැලපුම් දීමනා	-	-
ජීවන වියදම්දීමනාව- දේ.ණ.සහ සං. අ	2,878,318	2,950,870
කාර්ය මණ්ඩලය සඳහාප්‍රසාද දීමනා	-	825,000
සභාපති හට දීමනා	588,016	624,635
කොමසාරිස්වරුන් ගේ දීමනා	1,210,079	372,450
අතිකාල සහ නිවාඩුදින වැටුප්	293,021	148,186
සංවර්ධන සහකාර- ගමන්වියදම්	1,077,183	386,000
සංවර්ධන නිලධාරීසඳහා දීමනා	52,800	54,000
ගමන් වියදම් -කාර්යාල කාර්ය මණ්ඩලය	96,057	169,391
සේවක අර්ථසාධකඅරමුදල	2,131,450	2,265,441
සේවා නියුක්තිකයන්ගේභාර අරමුදල	532,862	566,360
කාර්ය මණ්ඩල සෞඛ්‍යරක්ෂණය	2,295,740	1,730,183
පාරිතෝෂික වියදම්	1,330,950	1,217,798
එකතුව	**29,386,782**	**29,388,809**

	2023	2022
වෙනත් මෙහෙයුම්වියදම්	රු	රු
කාර්ය මණ්ඩල සුභසාධන	618,155	456,730
රැස්වීම් සඳහාවියදම්	77,836	2,985
විගණන වියදම්	494,820	318,000
තැපැල් දුරකථන සහඅන්තර්ජාල පහසුකම්	550,181	477,722
ලිපිද්‍රව්‍ය/මුද්‍රණ	916,542	797,359
වාහන නඩත්තුව	1,523,630	260,489
ඉන්ධන	605,835	826,234
වාහන රක්ෂණ	74,271	72,415
විදුලිය	1,260,318	736,791
ආරක්ෂක ගාස්තු	1,432,021	1,092,510
ජල සැපයුම	49,902	28,040
පවිත්‍රතා සේවාගාස්තු	505,995	320,886
නඩත්තු සහ උපකරණ	495,114	142,745
නඩත්තු සහ ගොඩනැගිලි	137,005	29,000
කාර්ය මණ්ඩලපුහුණුසහ සංවර්ධන	257,890	-
පරිගණක නඩත්තුව	435,500	1,151,512
බදු සහ වරිපනම්	-	-
කාර්යාල කුලී	6,485,600	5,808,000
දැනුවත් කිරීමේවැඩසටහන්	-	-
වෘත්තීය ගාස්තු	97,245	95,102
පුවත් නිවේදන	-	-
නෛතික වියදම්	187,800	46,500
මුද්දර ගාස්තු	250	300
බැංකු ගාස්තු	2,538	810
වෙනත් වියදම්	195,157	96,000
එකතුව	**16,403,604**	**12,760,129**

21. සටහන - බැඳීම් සහ අවිනිශ්චිතතා

අරමුදලේ උපරිම දැනුම සහ ඊට ඇති තොරතුරු අනුව වාර්තාකරණ දිනයට අරමුදලට වැදගත් බැඳීම් සහඅවිනිශ්චිතතා කිසිවක් නැත.

22. සටහන - වාර්තාකරණ දිනයට පසුව හටගත් සිදුවීම්

ශේෂපත්‍රදිනය සහ ගිණුම් අත්සන් තබන ලද දිනය අතර කිසිදු සිද්ධියක් හටගෙන නොමැති අතරකිසිදු භෞතික ගැටළුවක් හටගෙන නොමැත. මූල්‍ය ප්‍රකාශයෙහි අනාවරණය කල යුතු වන්නාවූහෝ ගැලපුම් කල යුතු වන්නාවූ කිසිදු සිදුවීමක් නැත.

23. සටහන - වැදගත් අදාලපාර්ශව

වැදගත් අදාලපාර්ශව පිලිබඳ අනාවරණ විස්තර පහත පරිදි වේ;

23.1. සටහන - ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් සමග ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති අංක 24 ‘අදාල පාර්ශව අනාවරණ‘‘ අනුව ප්‍රධාන කළමණාකරන පුද්ගලයන්යන්නට සැලසුම් කිරීම, අධ්‍යක්ෂණය, සහ ව්‍යාපාරයේ කටයුතු පාලනය කිරීමට අධිකාරීත්වය ඇති පුද්ගලයන්ඇ තුලත්වේ. ඒ අනුව අරමුදලේ කොමසාරිස් මණ්ඩලය සමාගමේ ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් ලෙස වර්ග කර ඇත.

23.2 සටහන - ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් හට වන්දි

	2023	2022
	රු	රු
කෙටි කාලීනසේවා නියුක්ති ප්‍රතිලාභ		
කෙටි කාලීනසේවක ප්‍රතිලාභ	1,798,095	997,085

- ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් සමග ඇති කරගෙන තිබෙන සේවා නියුක්ති ගිවිසුම් අනුව ඔවුන්හට අරමුදල මගින් මුදල් නොවන ප්‍රති ලාභ කිසිවක් ලබාදී නොමැත.
- ප්‍රධාන කළමණාකරන පුද්ගලයන්, ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්, සහ ඔවුන්ගේ සම්බන්ධතා ඇති ආයතන සමග අරමුදල කිසිදු ගණුදෙනුවක් සිදුකර නොමැති අතර කිසිදු වැඩපිලිවෙලකට හෝ ගිවිසුමකට ද ඇතුලත්වී නොමැත.

24. සටහන - LLDF බණ්ඩ ලෙස විස්තිර්ණ ආදායම

	2023				
	දේ.ණ.සහ සං. ඇ.	LGIIP	PCDP	UDLIHP	ඒකාබද්ධ කිරීම්- දේ.ණ.සහඇ
පොලී ආදායම	256,478,553	125,411,611	3,235,626	45,172,727	430,298,518
පොලී වියදම	4,695,256	44,316,089	3,231,546	57,201,305	109,444,196
ශුද්ධ පොලී ආදායම	**251,783,297**	**81,095,523**	**4,080**	**(12,028,578)**	**320,854,321**
වෙනත් මෙහෙයුම්ආදායම්	16,190,784	-	-	-	16,190,784
මුළු මෙහෙයුම් ආදායම	**267,974,080**	**81,095,523**	**4,080**	**(12,028,578)**	**337,045,105**
අපහායන ගාස්තු	(106,161,470)	(11,765,711)	(2,376,070)	(47,258,427)	(167,561,679)
ශුද්ධ මෙහෙයුම්ආදායම	**161,812,610**	**69,329,812**	**(2,371,991)**	**(59,287,005)**	**169,483,426**
පුද්ගල වියදම්	23,364,516	7,070,675	**356**	(1,048,765)	29,386,782
ක්ෂයPPE	5.687.636	1,721,218	87	(255,301)	7,153,640
ප්‍රදාන ක්‍රමක්ෂය	-	-	-	-	-
වෙනත් මෙහෙයුම්වියදම්	29.029.687	8,785,094	**442**	(1,303,058)	36,512,166
බදුවලට පෙරමෙහෙයුම් ලාභය	**103.730.770**	**51,752,824**	**(2,372,875)**	**(56,679,880)**	**96,430,838**

	2022				
	LLDF	LGIIP	PCDP	UDLIHP	ඒකාබද්ධ කිරීම්- දේ.ණ.සහ ඇ
පොලී ආදායම	232,616,479	150,123,894	3,524,512	55,596,010	441,860,894
පොලී වියදම	5,908,991	46,535,795	3,497,692	57,827,045	113,769,524
ශුද්ධ පොලී ආදායම	**226,707,487**	**103,588,099**	**26,819**	**2,231,035**	**328,091,371**
වෙනත් මෙහෙයුම්ආදායම්	12,943,541	-	-	0.05	12,943,541
මුළු මෙහෙයුම් ආදායම	239,651,028	**103,588,099**	**26,819**	**2,231,035**	**341,034,912**
අපහායන ගාස්තු	(203,055,214)	(28,735,628)	(5,611,161)	(103,427,521)	(340,829,524)
ශුද්ධ මෙහෙයුම්ආදායම	**442,706,242**	**132,323,727**	**5,637,981**	**101,196,486**	**681,864,436**
පුද්ගල වියදම්	20,652,016	8,926,743	**2,311**	192,260	29,388,809
ක්ෂයPPE	787,705	340,482	88	7,333	1,120,942
ප්‍රදාන ක්‍රමක්ෂය	-	29,997,185	-	-	29,997,185
වෙනත් මෙහෙයුම්වියදම්	9,835,204	4,251,223	**1,101**	91,561	13,995,967
බදුවලට පෙරමෙහෙයුම් ලාභය	**411,431,318**	**88,808,093**	**5,634,481**	**101,487,640**	**607,361,533**

*මූල්‍ය වර්ෂය අවසානයේදී ගෙවිය යුතු ප්‍රාග්ධනය මත පදනම්ව අපහායන ගාස්තු බෙදා ඇත.

**එක් එක් බණ්ඩයෙහි මුළු මෙහෙයුම් ආදායම මත මෙහෙයුම් පිරිවැය බෙදනු ලැබේ.

25. සටහන - සාධාරණ අගයන්

ආදර්ශයන් සඳහා බාහිරින් කැඳවනු ලබන මිල ගණන් ඇසුරින් හෝ නිරීක්ෂණය කළ හැකි මිල යෙදවුම් ඇසුරින් සාධාරණ අගය තීරණය කරනු ලබනා අවස්ථාවන්හි දී මූල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිල තීරණයන හෝ තහවුරු කිරීම් ලබාගන්නා ලදී. ක්‍රියාශීලී වෙළඳපලකදී විකුණුම් මිල පිලිබඳ සෘජු නිරීක්ෂණයන් කළ නොහැකිය. මේ තත්වයන් යටතේ අරමුදලේ මූල්‍ය උපකරණයන්හි වලංගුතාව තහවුරු කිරීම පිණිස, වඩා අදාල සහ විශ්වසනීයසේ සැලකෙන තොරතුරුවලට වැඩි බරක් තබමින් විකල්ප වෙළඳපල තොරතුරු භාවිතා කරයි.

ඇගයුම් තාක්ෂණවේදයන් මගින් මූල්‍ය උපකරණයන්හී සාධාරණ අගය තීරණය කිරීම හෝ අනාවරණය කිරීම පිණිස අරමුදල පහත සඳහන්ධූ ධුරාවලිය භාවිතා කරයි.

අදියර 1 - සමාන වත්කම් සහ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපලින් කැඳවන ලද මිල ගණන් (ගැලපුම නොකරන ලද)

අදියර 2 - සෘජුව හෝ වක්‍රව වාර්තා කරන ලද සාධාරණ අගය මත වැදගත් බලපෑමක් ඇත්තා වූ සියළු යෙදවුම් නිරීක්ෂණය කළ හැකි අනෙක් තාක්ෂණවේදයන්.

අදියර 3 - නිරීක්ෂණය කළ නොහැකි වෙළඳපල දත්ත මත පදනම නොවන වාර්තා ගත සාධාරණ අගය මත වැදගත් බලපෑමක් ඇති යෙදවුම් භාවිතා කරන ශිල්ප ක්‍රම

මූල්‍ය ප්‍රකාශණයන් හී සාධාරණ අගය මගින් නොදැක්වෙන අරමුදලේ මූල්‍ය උපකරණවල සාධාරණ අගය සහ ඉදිරියටගෙනා අගය පිලිබඳ පංතිය අනුව සංසන්දනයක් පහත දැක්වේ.

	සාධාරණ අගය පිලිබඳ ධුරාවලිය	ඉදිරියට ගෙනා වටිනාකම්		සාධාරණ අගය	
දෙසැම්බර් 31 දිනට		2023	2022	2023	2022
		රු	රු	රු	රු
මූල්‍ය වත්කම්					
මුදල් සහ මුදල් සමාන දෑ		96,667,455	121,162,801	96,667,455	121,162,801
බැංකු ශේෂයන්		685,058,333	598,000,000	685,058,333	598,000,000
ණය සහ ලැබිය යුතු දෑ	අදියර 2	2,865,193,520	3,264,343,263	1,104,656,135	1,258,545,639
වෙනත් වත්කම්		103,535,383	99,691,917	103,535,383	99,691,917
එකතුව		**3,750,454,691**	**4,083,197,980**	**1,989,917,305**	**2,077,400,357**
මූල්‍ය වගකීම්					
ණයට ගැනුම් සහභාණ්ඩාගාරයට ගෙවුම් සඳහා දරණ පොලිය	අදියර 2	4,015,006,605	4,263,982,469	1,185,642,579	1,259,165,842
වෙනත් වගකීම්		48,345,271	7,811,220	48,345,271	7,811,220
එකතුව		**4,063,351,876**	**4,271,793,689**	**1,233,987,850**	**1,266,977,062**

(අ) කෙටිකාලීනව කල් පිරෙන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා (මාස තුනකට අඩු) ඉදිරියටගෙනා වටිනාකම ඒවායේ සාධාරණ අගයට දළ වශයෙන් සමාන වන බව උපකල්පනය කෙරේ. මෙකී උපකල්පනය අතැති මුදල්, බැංකු ශේෂයන්, අනෙක් මූල්‍ය වත්කම්, බැංකු අයිරා සහකල්පිරෙන විශේෂිත කාලයක් නැති අනෙක් මූල්‍ය වගකීම් සඳහා අදාල වේ.

(ආ) සාමාන්‍යණය කාලසීමාව සඳහා වන සාමාන්‍ය ණය අනුපාතය භාවිතා කරමින් ස්ථාවර පොලී අනුපාත ඇතිලැබිය යුතු ණය සාධාරණ අගයට ලක් කෙරිණි. මීට ප්‍රතිවිරුද්ධව පොලී සහිත ණය සහභාණ්ඩාගාරයට ගෙවිය යුතු වටිනාකම් බරතැබූ සාමාන්‍ය අරමුදල් පිරිවැය මත වට්ටම් කරන ලදී.

26. සටහන - වත්කම් සහ වගකීම් කල් පිරීම

	2023			2022		
	වසරකට අඩු	වසරකට වැඩි	ඉදිරියට ගෙනා මුළු වටිනාකම	වසරකට අඩු	වසරකට වැඩි	ඉදිරියට ගෙනා මුළු වටිනාකම
වත්කම්	රු	රු	රු	රු	රු	රු
මුදල් සහ මුදල් සමාන දෑ	96,667,455	-	96,667,455	121,162,801	-	121,162,801
බැංකු ශේෂයන්	685,058,333	-	685,058,333	598,000,000	-	598,000,000
ණය සහ ලැබියයුතුදෑ	343,823,222	2,521,370,298	2,865,193,520	391,721,192	2,872,622,071	3,264,343,263
දේපල පිරියත සහ උපකරණ	-	7,088,731	7,088,731	-	1,830,898	1,830,898
විලම්බිත බදුවත්කම්	-	7,881,953	7,881,953	-	7,856,456	7,856,456
වෙනත් වත්කම්	103,535,383	-	103,535,383	99,691,917	-	99,691,917
මුළු වත්කම්	1,229,084,393	2,536,340,982	3,765,425,374	1,210,575,909	2,882,309,425	4,092,885,334
වගකීම්						
පොලී සහිත ණය සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු	241,981,083	3,773,025,522	4,015,006,605	241,981,083	4,022,001,386	4,263,982,468
වර්තමාන බදුවගකීම	-	36,688,054	36,688,054	-	36,418,499	36,418,499.10
විලම්බිත බදුවගකීම	-	-	-	-	-	-
පශ්චාත්‍රැකියා නියුක්ති වාසි පිලිබඳ බැඳීම්	-	8,249,612	8,249,612	-	4,853,000	4,853,000.37
වෙනත් වගකීම්	41,657,400	6,687,871	48,345,271	7,137,767	673,453	7,811,220.42
එකතුව	283,638,483	3,824,651,059	4,108,289,542	249,118,850	4,063,946,339	4,313,065,189

හෙලිදරවු කිරීම්

විගණනය සහ වගකීම

ආයතනික තත්වය සහ අනාගතය ඇගයීම

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සහිතව මෙම ආයතනයේ අනාගත දැක්මට අනුව රාජ්‍ය අංශයේ "සී" පංතියේ ආයතනයක් වශයෙන් කටයුතු කරගැනීම සඳහා ආයතනයේ කාර්යය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකර ඇත.

මනා අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා අවදානම් කළමනාකරණය

කොමසාරිස් වරුන් විසින් ක්‍රියාවට නංවන ලද අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය මගින් ආයතනයේ ආයෝජන සහ වත්කම් සුරක්ෂිත භාවය තහවුරු කර ඇත. තවද අභ්‍යන්තර පාලන ක්‍රම වල පවතින ආවේණික අඩුපාඩු හේතුකොටගෙන ඇතිවන වැරදි සහ වංචා සම්බන්ධව කොමසාරිස් මණ්ඩලය දැනුවත් වීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මකව ඇත.

අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵලතාවය සම්බන්ධව කලින් කල සිදුකරන විමර්ශන

කොමසාරිස් වරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් සිදුකරන විමර්ෂණ ඇසුරින් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධ නිරීක්ෂණ කොමසාරිස් මණ්ඩලයට යොමුකරන අතර කොමසාරිස් මණ්ඩලය මගින් නියමිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය

පාලක මණ්ඩල කොමසාරිස්වරුන් විසින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) වලට අනුකූලව සකස්කර ඇති බවට සහතික කරන අතර,මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය දැනට පවතින අදාළ නීති සහ ක්‍රියාත්මක භාවයන්ට අනුකූලව සිදු කර ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කර ඇති බවටද සහතික කරයි.

අඛණ්ඩ පැවැත්ම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල නියමිත ද්‍රවශීලතා තත්වයන් යටතේ එහි රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

ව්‍යවස්ථාපිත බැඳීම්

කොමසාරිස් වරුන් විසින් ඔවුන්ගේ දැනුම සහ විශ්වාසයට අනුව රජයට ඇති මූල්‍යමය බැඳීම් හා ව්‍යවස්ථාමය වශයෙන් සේවකයන්ට ඇති බැඳීම් සඳහා නියමිත ගෙවීම් කර ඇති බව හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල සලසා ඇති බව සම්බන්ධයෙන් සෑහීමකට පත්වේ.

අනෙකුත් පාර්ශවයන් සමග ඇති සම්බන්ධතාවය

සේවකයන්

පාලක මණ්ඩලය විසින් සම්පාදිත ආයතනයේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ සම්බන්ධව ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් වී ඇත. අවම වයස් සීමාවට අඩු කිසිම පුද්ගලයෙකුට ආයතනයේ රැකියා අවස්ථා සලසා නොමැත. ආයතනයේ රැකියා අවස්ථා සහ උසස්වීම් සඳහා ජාතිය, ලිංගභේදය ආදී වෙනස්කම් සැලකිල්ලට භාජනය නොකෙරේ.

නියාමන ආයතන

මහා භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අර්ථවත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සම්බන්ධව කොමසාරිස් මණ්ඩලය සහතික වී ඇත. ආයතනයේ පැවැත්ම සහ ක්‍රියාකාරීත්වය අදාළ ආයතන මගින් නිකුත් කරන නීති සහ නියෝග නිසි පිලිපැදීම මගින් සහ රටේ පවතින නීතිවලට අනුකූලතාව දැක්වීමෙන් සාක්ෂාත් වී ඇත.

පරිසරය

ආයතනය සහ නිලධාරීන් පිළිගත් සම්මත උපයෝගීකරගැනීම මගින් පරිසර පද්ධතිය මනා ලෙස පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් විශේෂ සැලකිල්ල යොමු කොට ඇත.

තිරසාර සංවර්ධන අභිමතාර්ථ

2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනත මගින් නීතිගතකර ඇති සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ හඳුනාගෙන එම ඉලක්ක සපුරාගැනීම සඳහා ව්‍යාපාර සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සහ වැඩපිළිවෙලක් සකස්කොට ඇත.

ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති

ආසියානු සංවර්ධන බැංකු ණය අංක1632 SRI (SF) - (UDLIHP)
නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ 1998 වර්ෂයේ සිට 2002 දක්වා ක්‍රියාත්මක කරනු ලැබූ ඉහත ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය ආපසු අය කර ගැනීමේ ආයතනය වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 27ක් සඳහා නිකුත්කළ ණය වල වටිනාකම රු.මි.2,270 ක් වේ. මෙම ව්‍යාපෘති අතුරින් 90% ක ණය අයකිරීම් කරගෙන යනු ලබන අතර ඉතිරි ව්‍යාපෘති වල ණය ආපසු අයකිරීමේ ගැටළු පැන නැඟී ඇත. මීට ප්‍රධාන හේතුව වශයෙන් දැක්විය හැක්කේ මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණ අසාර්ථක වීමත් අනෙකුත් ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් ද විවිධ ගැටළු පැනනැඟී ඇති වීමත්ය.

පසුගිය වසර 05 ක ණය අයකිරීමේ ප්‍රගතිය (UDLIHP) : **(වගු අංක 6.1)** (රු.මි)

වර්ෂය	ණය වාරික අයකිරීම්	පොළී අයකිරීම්
2019	96.0	68.1
2020	100.9	62.0
2021	107.8	58.0
2022	112.6	52.8
2023	97.4	44.0

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) - (LGIIP)
පළාත් පාලන යටතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2006 සිට 2012 දක්වා ක්‍රියාත්මකවූ ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) දරණ පළාත් පාලන යටතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා 2006 ජනවාරි මස ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන ලදී. ඉහත ව්‍යාපෘතිය යටතේ නාගරික යටිතල පහසුකම් සහ මූලික නාගරික සේවා වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීමේ කාර්යයන් ඇතුලත් වේ. ඒ යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් හඳුනාගෙන තිබුණි.

1. ග්‍රාමීය ජල සම්පාදනය
2. පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග සංවර්ධනය
3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
4. නාගරික ජලාපවහන සහ මළාපවහන පද්ධතිය සංවර්ධනය
5. කුඩා පරිමාණ ප්‍රජා යටිතල පහසුකම් (මූලික සෞඛ්‍ය සායන හා පුස්තකාල ආදිය)

උක්ත ව්‍යාපෘතිය පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයයෙන් මෙහෙයවූ අතර පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා වෙන් කරන ලද මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 42.5 කි. මෙය 100% ක ණය මුදලක් වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර, වසර 08ක සහන කාලයක් සමග වසර 32 කින් මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවිය යුතුය. සහන කාලය තුලදී

පොළී අනුපාතය 1% ක් වන අතර සහන කාලයෙන් පසු 1.5% කි.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ව්‍යාපෘති සඳහා ණය සහ ප්‍රදාන වශයෙන් කොටස් 02 කි. පළාත් පාලන ආයතන වල වර්ගීකරණය අනුව ණය මුදල 33% සිට 53% දක්වා වන අතර, ප්‍රදානය 40% සිට 60% දක්වා වේ. යටකී ප්‍රදානය දැරිය යුතුව ඇත්තේ ණය සඳහා වන 9% ක පොළී මුදලිනි. මේ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඉතා විශාල අවදානමක් දැරිය යුතුව ඇත.

උප ව්‍යාපෘති ශක්‍යතාවය පළාත් පාලන ආයතනවල ඉදිරි ආදායම් මත නිගමනය වේ. මූල්‍ය සහ පළාත් පාලන ක්‍රියාකාරී සැලැස්ම සහ හැකියා වර්ධන ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය අංග වන අතර එම අංග ක්‍රියාත්මක වීම මගින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය අයකරගැනීම සුරක්ෂිතතාවය සහතික වන අතරම, ණය පැහැර හැරීමේ අවදානම අඩුවේ. ඒ අතරම ණය ආපසු ගෙවීම් නිසි පරිදි සිදුවීමට පළාත් පාලන ආයතන වල මූල්‍ය තත්වය ශක්තිමත් හා තිරසර විය යුතුය. එමෙන්ම අරමුදලෙන් නැවත ණය ලබාගැනීම සඳහා එකී ශක්‍යතාවය වැදගත්වේ. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි අරමුණ ඉහත පරිදි වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත නිකුත්කළ ණය සහ ප්‍රධානයන්ගේ වටිනාකම රු.මි.4,654 ක් වන අතර පළාත් පාලන ආයතන වර්ගය අනුව ණය සහ ප්‍රදාන ලබාදී ඇති ආකාරය පහතින් දැක්වේ.

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ණය සහ ප්‍රදානබෙදී ගොස් ඇති ආකාරය (LGIIP) : **(වගු අංක 6.2)**

පළාත් පාලන ආයතන වර්ගය	ණය මුදල	%	ප්‍රදානය	%	එකතුව	%
මහ නගර සභා	254	53	192	40	433	93
නගර සභා	263	43	306	50	543	93
ප්‍රාදේශීය සභා	1,291	33	2,348	60	3,678	93
එකතුව	1,808		2,846		4,654	

පසුගිය වසර 05 ක ණය අයකිරීමේ ප්‍රගතිය (LGIIP) :**(වගු අංක 6.3)** (රු.මි)

වර්ෂය	ණය වාරික අයකිරීම්	පොළී අයකිරීම්
2019	181.8	77.5
2020	186.2	62.5
2021	176.6	46.3
2022	134.3	33.6
2023	60.6	26.6
එකතුව	739.5	246.5